
# මෙත් සවිය


මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❊ 2015 දෙසැම්බර් ❊ මෙත් සවිය දහතුන් වන කාණ්ඩය ❊ විසිහත් වන කලාපය

METHSAVIYA NEWSLETTER



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා



ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපැල : office@methsaviya.org


මෙත් සවිය
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය
හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලිම
මෙත් සවිය විසින් අරඹන ලදී.
ඇස්තමේන්තු ගත මුදල
රුපියල් ලක්ෂ 350 ක්
පමණ වේ.
මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න
0714 0144 67, 0112 50 50 88
office@methsaviya.org

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.

දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org


## මෙත් සවිය 2015 වසර සඳහා පත් වූ විධායක කමිටුව

### ගරු පැවිදි අනුශාසක

ගරු පැවිදි අනුශාසක, ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත,
වංසාලංකාර අමරපුර නිකායේ
ගරු අධිකරණ සංඝනායක

අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

### ගරු සභාපති

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා
අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී

මහාචාර්ය චන්දන ජයරත්න මහතා.

දූ.ක : 0714800800 ෆැක්ස් : 0115678000
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

### ගරු උප සභාපතිවරු

වෛද්‍ය කාංචන ඇලපාත මහතා.
වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා.

### ගරු සම ලේකම්වරු

එච්. එම්. චින්තක බණ්ඩාර මහතා.
දූ.ක : 0718114477
සුරංග ලියනගේ මහතා.
දූ.ක : 0775994987

### ගරු භාණ්ඩාගාරික

චමින්ද ඉන්දික මහතා.
දූ.ක : 0712299212

### ගරු උප භාණ්ඩාගාරික

ඉන්දික තෙන්නකෝන් මහතා.

### ගරු සංස්කාරක

එම්. කේ. ප්‍රියන්ත මහතා
දූ.ක : 0712285680

### ගරු කාරක සභිකවරු

ධර්මසිරි ජයසිංහ මහතා
ප්‍රදීප් යහම්පත් මහතා
සම්පත් රත්නතිලක මහතා
මෙනුර ඩයස් මහතා
දර්ශන ගලප්පත්ති මහතා
ධනුෂ්ක ගයාෂාන් මහතා

### වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති

මංජුල පද්මකුමාර මහතා

### බුදු පිළිම කමිටුව - සභාපති

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

### කාන්තා කමිටුව - සභාපතිනිය

රංජනී උඩුගොඩ මහත්මිය

### තරුණ කමිටුව - සභාපති

ප්‍රසාද් අබේසිංහ මහතා

### අසරණ සරණ කමිටුව - සභාපතිනිය

ඩී. එම්. ජී. ආර්. හේරත් මහත්මිය

## අප ගැන වචනයක්

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහයකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. වර්තමාන සාමාජික සංඛ්‍යාව 4500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරනය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යයාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවලදි පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - ශීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය පවත්වා ගනිමින් **"මෙත් සවිය"** මෛත්‍රී සංසදය පසුගිය දශකය පුරා සමථ විපස්සනා භාවනාවන් භාරදහස් පන්සීයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද "මෙත් සවිය" වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදිප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදිපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහි වන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම පිළිකා රෝහල ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### පළමුවෙනි ඉරුදින මාසික රැස්වීම

සෑම මසකම පළමුවෙනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන් දාන - සීල - භාවනා වැඩසටහන් සඳහා (සඳහම් චාරිකාවේ නොයෙදෙන දින වලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශි බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුන ද නොලැබුන ද සෑම මසකම පළමුවන ඉරුදින (සඳහම් චාරිකාවල යෙදෙන දින වලදී හැර) ඉහත මාසික රැස්වීම් සඳහා ප.ව. 2.00 - 4.00 අතර කාලය තුල පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටින්නෙමු. ඉදිරි වැඩ සටහන් පිළිබඳ තොරතුරු වෙබ් අඩවියෙන් ද ලබාගත හැක. මෙම වැඩ සටහන් සඳහා දිවයිනෙහි සුප්‍රසිද්ධ ධර්මදේශක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩම කරවීම හෝ පෞරුෂ වර්ධන යෝග වැඩසටහන් ආදී විශේෂිත වැඩසටහනක් හඳුන්වාදීම සඳහා ගිහි භවතකු හට හෝ ආරාධනා කිරීම කරනු ලැබේ. මේ සඳහා සාමාජිකයන්ගේ යෝජනා වෙතොත් සභාපති / ලේකම් තුමා වෙත දන්වන්න.

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### 2016 ප්‍රථම දින වසරේ ප්‍රථම දානය

2016. 01 . 01 දින කොළඹ හුණුපිටියේ, ගංගාරාම විහාරස්ථානයේ දී වර්ෂය ආරම්භ කිරීම නිමිතිකොට ගෙන පවත්වනු ලබන සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවට සහභාගී වන සංඝයා වහන්සේලා උදෙසා අළුයම පවත්වනු ලබන හීල් දානමය පුණ්‍යකර්මය සඳහා සහභාගී වීමට කැමති මෙත්සවිය සාමාජිකයින් එදින පෙ.ව. 6.15 ට ගංගාරාම විහාරස්ථානය වෙත පැමිණිය යුතුය. පෙ.ව. 8.00 ට පෙර දානයේ වැඩ කටයුතු අවසන් වේ. මේ සඳහා අවශ්‍ය කිරිබත්, ඉඳිආප්ප, සීනි සම්බල්, පලතුරු, පිරිකර ආදී දානමය ද්‍රව්‍යයන් භාරගැනීමට කැමති පින්වතුන් ඇත්නම්, **කාර්යයාලය (071 401 44 67) හෝ දාන සංවිධායක වික්‍රම ගුණදාස මහතා (071 22 10 620) අමතා** තොරතුරු ලබා ගන්න.

### 2016 ජනවාරි මස පළමු දින ජයන්ති ළමා නිවාසයට දහවල් දානය හා උපකරණ ලබාදීම

2016. 01 . 01 දින ජයන්ති ළමා නිවාසයට දහවල් දානය සහ අවශ්‍යය උපකරණ පරිත්‍යාග කිරීම සිදු කෙරේ. කැමති පිංවතුන් පෙ.ව. 12.00ට බෞද්ධාලෝක මාවතේ සමස්ථ ලංකා බෞද්ධා මහා සංමේලනය පිටුපස ඇති ජයන්ති ළමා නිවාසයට පැමිණෙන්න. රෙදි සෝදන ලොකු බේසම් සහ වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කළ හැක.

### මීළඟ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

34 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන 2016/01/17 වන ඉරු දින ආරම්භ වීමට නියමිතය. ඒ සඳහා 2015/12/28 දිනට තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

### 2016/03/01 ඉරු දින - සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වන වැඩමුළුව

සාමපිකයින් සඳහා සහ ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පැවැත්වෙන මෙම ඉතා වැදගත් වැඩසටහන ප.ව 1 සිට ප.ව 5 දක්වා බොරැල්ල YMBA ශාලාවේ දී පැවැත්වේ. මිනිසා විසින් උපතේ සිට මරණය දක්වා නොකඩවා සිදුකරන ක්‍රියාවලියක් වන ඉගෙනීම නිසි පරිදි සිදු කරන අයුරු පැහැදිලි කරන මේ වැඩමුළුව ළමා හා වැඩිහිටි සියලු දෙනාටම වැදගත්ය. මෙත්සවිය සංසදයේ සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පවත්වන සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද පිළිබඳ වැඩමුළුවට ඔබට හා ඔබේ දරුවාට ද සහභාගී විය හැක. සාමාජික භවතා සමඟ නොපැමිණ ළමුන් තනිව පැමිණෙන්නේ නම් උප්පැන්න සහතිකයේ පිටපතක් හා සාමාජිකයාගේ ලිපියක් රැගෙන ආ විට නොමිළයේ සහභාගි විය හැකිය. එක් සාමාජිකයෙක් සඳහා එක් මුද්‍රිත සටහනක් පමණක් සැපයේ. සාමාජික නොවන බාහිර සිසු සිසුවියන්ට හා අන් අයටද සහභාගී විය හැකි අතර මුද්‍රිත ද්‍රව්‍ය හා ශාලා ගාස්තු සඳහා යන බරපැන පියවීම සඳහා එවැනි අයෙකු විසින් රු. 500/- ක මුදලක් එදිනට ආයෝජනය කල යුතු වේ. මේ සඳහා 2016 - 02 - 25 දිනට පෙර 0714 0144 67 හෝ 0112 50 50 88 අමතා ලියාපදිංචි වන්න. වයස 12 ට වැඩි ඕනෑම අයෙකුට සහභාගී විය හැකිය. පාඩම් කිරීමේ නවීන ක්‍රම, වේගයෙන් ලිවීමේ, කියවීමේ ක්‍රමවේද, ඉගෙනීමට බාධාවන මානසික රෝග හඳුනාගැනීම, මතකය වර්ධනය සඳහා ක්‍රියාමාර්ග, බුද්ධි වර්ධන අභ්‍යාස, කාලසටහන් තැනීම, ස්වයං යෝජනා ක්‍රම හා විභාගයකදී සමත් වීමට පිළිතුරු ලියන පිළිවෙල ආදී වැදගත් කරුණු රාශියක් මෙහි දී ප්‍රායෝගිකව හඳුන්වා දේ. සාමාජික කණ්ඩායම් අංක 1 සිට 28 දක්වා මීට ඉහත දී මෙම වැඩසටහනට සහභාගී වී ඇති සාමාජිකයින් ඔවුන් වෙත ඇති මුද්‍රණ සටහන් රැගෙන ඒමට කාරුණික වන මෙන් ඉල්ලා සිටිමු.

### 2016 අප්‍රේල් 03 වන ඉරු දින මෙත් සවිය, වාර්ෂික මහ සභා රැස්වීම / ධර්ම දේශනාව සහ මෛත්‍රීභූෂණ සම්මාන උලෙළ.

2015 අයවැය ඉදිරිපත් කිරීම හා නව නිලධාරි මණ්ඩලය පත්කර ගැනීම කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්මගවේශී බෞද්ධ ආශ්‍රමයේදී, ධර්ම දේශනාව අවසානයේ දී පැවැත්වේ. එදින සාකච්ඡාව සඳහා නව යෝජනා ඇති නම් 2016 - 03 - 03 දිනට පෙර කාර්යාලයට භාර දෙන්න. මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියලුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට පළමුව සාමාජිකත්වය අලුත් කරගන්නා මෙන් ඉල්ලමු. එදින අනුපමේය සේවයක් කර ඇති පුද්ගලයින්ට මෙත් සවිය ගෞරව උපහාර සම්මාන පිරිනැමීමට බලාපොරොත්තු වේ.

### 2016 ජනවාරි 03 වන දින පළමුවෙනි මාසික ඉරු දින රැස්වීම සහ 2016 වසර සඳහා නොමිළයේ බෙදා හරිනු ලබන මෙත්සවිය දින දර්ශනය ලබා දීම

මෙදින ධර්ම දේශනාව පවත්වනු ලබන්නේ අමරපුර වජිර වංශ පාර්ශවයේ මහානායක ශාස්ත්‍රපති පණ්ඩිත නෙල්ලිවල විමලජෝති හිමි විසිනි. 2016 දින දර්ශනය ද මෙදිනට බෙදා දෙනු ලැබේ. බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂි බෞද්ධාශ්‍රමයේ දී වැඩසටහන පැවැත්වේ. දින දර්ශනය මෙත්සවිය කාර්යයාලයෙන් ද ලබාගත හැක.

### මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් 2016 - 02 -15 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

### පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන්න

පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන මෙන් සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

### මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

### සුව සෙත

ප්‍රාණ / විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් පුද්ගලයින් විසින් රෝග සුවකිරීමේ නොමිලයේ පැවත්වෙන සුව සෙත වැඩසටහන ඉරු දිනවල දී පෙ.ව. 11.00 - 2.00 දක්වා (මාසයේ පළමු ඉරු දින හැරෙන්නට) ශ්‍රී විජයාරාමයේ දී පැවැත්වේ.

කාර්යයාලයෙන් හෝ කමිටු සභාපති **ප්‍රභාත් විජේසිංහ (0777 328 565) මහතාගෙන් විමසා පැමිණෙන්න.**

**මෙත් සවිය කමිටුවල ප්‍රගති සමාලෝචන...**



# බුදුපිළිම කමිටුවේ ප්‍රගති සමාලෝචනය

බුදු පිළිම කමිටුව මගින් 2014 ජුලි 23 දින එහි සාමාජිකයන්, මෙත්සවිය සාමාජිකයන් සහ විශේෂ ආරාධිතයන් රාශියකගේ සහභාගිත්වයෙන් මහියංගනය මියු ගුණ සෑ රදුන්ට කප්රුක් පූජාවක් පවත්වා මහා සංඝ රත්නය ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කරන අතර තුර තුන්වන අදියරය සඳහා මුල් ගල තබන ලදී.

මෙම ඉදිකිරීම් සඳහා මුදල්ආධාර එකතු කිරීම සඳහා කමිටු සාමාජිකයන් සහ මෙත්සවිය සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් ආධාර රැස් කිරීමේ වැඩසටහන් සිව් වරක් මහියංගණය පූජා භූමිය තුල ඉතා සාර්ථකව සිදුකර විශාල ආධාර මුදලක් දහස් සංඛ්‍යාත සැදැහැවතුන්ගෙන් රැස් කරගැනීමට හැකිවිය. තවද රත්නපුරයේ මැණික් ව්‍යාපාරිකයන්ගෙන් ආධාර රැස් කිරීම පිණිස දෙවතාවක් එහි සංචාරයන් සිදුකර ඇත. එමෙන්ම ටිකට් පත් විකිණීම ද ඇතුළුව අරමුදල සඳහා 2015 ඔක්තෝබර් 31 වන දින වන විට සැදැහැවතුන්ගෙන් ලැබී ඇති මුළු අධාර මුදල රුපියල් මිලියන 10 පමණ වේ.

අරමුදල් පිලිබඳ විධිමත් මූල්‍ය වාර්තාවන් සැකසීමේ, ගිණුම් තැබීමේ හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ ක්‍රියාපටිපාටි හඳුන්වාදී, සියළුම කටයුතු මනා විනිවිදභාවයකින් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම අරමුදලේ නිරවද්‍යතාවය හා සාධාරණතාවය තහවුරු කිරීම සඳහා මේ වන විට අරමුදල ආරම්භ වූ දිනයේ සිට 2015 ජූනි 30 වන දින දක්වා අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත.

තවද බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ඇති බාධාවන් දුරුවීම පිණිස නිරන්තරයෙන් බුද්ධ පූජාවන් පැවැත්වීම කමිටු සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

බුද්ධප්‍රතිමාවහන්සේ ඉදිකිරීම් කටයුතු වලට අදාලව විධිමත් සැලසුම් හා ඇස්තමේන්තුවක් සකසා පිලිගත් ඉදිකිරීම් ක්‍රියාපටිපාටීන්ට අනුකූලව ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවකු සහ ප්‍රතිමාව නිර්මාණය කිරීම සඳහා ප්‍රවීන මූර්ති ශිල්පියකුගේ සේවය ලබා ගැනීමට මේ වනවිට සමත්ව ඇත. මහියංගණය රාජමහා විහාරයේ භාරකාර අතිපූජ්‍ය උරුලෑවත්තේ ධම්මරක්ඛිත ස්වාමීන්වහන්සේගේ මූලිකත්වයෙන් තෝරා ගත් මූර්තිශිල්පියා හා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර නොබෝදිනකින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

මෙම මහගු කර්තව්‍යය සඳහා සියලු උපදෙස් සහ අනුශාසනා කරනු ලබන අතිපූජ්‍ය උරුලෑවත්තේ ධම්මරක්ඛිත හිමිපානන් වහන්සේටත්, අතිපූජ්‍ය අහංගම ආනන්ද හිමිපානන් වහන්සේටත්, මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා ට මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ජයසිංහ මහතාට මෙන්ම තම ධනය පරිත්‍යාග කරමින් ද, දහසකුත් කටයුතු මධ්‍යයේ තම කාලය හා ශ්‍රමය කැපකරමින් ද සහයෝගය දක්වන මෙත්සවිය සියලූ කමිටු සාමාජිකයන්ට, සියලූ මෙත්සවිය සාමාජිකත්වයට බුදුපිළිම ක්‍රියාකාරී කමිටුව ස්තුතිපූර්වකව පුණ්‍යානුමෝදනා කර සිටි.

මෙම මහගු අට මහා කුසල කර්මය සඳහා මෙත්සවිය සාමාජිකයන් වන ඔබට මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ලෙස ආධාර ලබාදිය හැකිය. වැඩි විස්තර දුරකථන අංක 0719 441 269 මගින් ලබා ගන්න.



## මෙත් සවිය ටී ෂර්ට්

**මෙත් සවිය නාමය සහිත, සුදු පැහැති ටී ෂර්ට් එක රු. 1000/- ක් දී** මෙත්සවිය කාර්යාලයෙන් ලබා ගත හැක. මින් ලැබෙන ප්‍රතිලාභ සියල්ල **කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයේ බවුන්සෙත් මානසික සුව සෙවනෙහි ඉදිවෙන මෙත් සවිය භාවනා කුටිය තැනීමට වැයකරනු ලැබේ.**



*තණ බිස්සේ රැඳී පිණි කැට මොහොතින් වියැකී නොයාද*
*මල් ගොමුවේ පිපෙණ කුසුම් සවසට අවරට නොයාද*
*උදෑසනට නැගෙනා හිරු සවසට අවරට නොයාද*
*නොනිමි සසර ලැබූ ජීවිය දිනකදී අත්හැර නොයාද*

*මුසා බසින් ලොව රවටා සැප පිණිසා රඟනු කිමද*
*සසර දුකය බැඳීමය මේ කියමින් සුසුමින් නැවෙමුද*
*අවිදු අඳුර දුර්ලාලා නොතිර බවින් ලොව දකිමුද*
*සැප අනැරා බවුන් වඩා නිවනට මග සොයා යමුද?*

භාග්‍යා සුභාෂිනී පෙරේරා - 31 වැනි කණ්ඩායම

# තරුණ කමිටුව මේ දක්වා ආ ගමන්මග

නව තරුණ කමිටුව 17/05/2015 දින මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් 15 දෙනකුගෙන් සමන්විත නිලධාරී මණ්ඩලයක් පත්කර ස්ථාපිත කෙරුනි. වර්තමානය වනවිට සාමාජික සංඛ්‍යාව 32 වේ. තරුණ පරපුරේ ආධ්‍යාත්මික ශක්තින් හා ගුණාංගයන් වර්ධනය කිරීම, බුදුදහම අනුගමනය කරන තරුණ පිරිස් එක්රැස් කර කල්‍යාණ මිත්‍ර සම්පත්තියක් ඇති කිරීමත්, තාරුණ්‍යයේ ජවය හා ශක්තිය ඔවුන්ගේ හා සමාජයේ අභිවෘර්ධිය සඳහා ඵලදායීව යොදාගැනීම අපගේ මූලික අරමුණු වේ.

අපගේ පළමු ව්‍යාපෘතිය ලෙස ශ්‍රී විජයාරාම විහාරස්ථාන භූමිය පවිත්‍ර කිරීමේ ශ්‍රමදානය හා සක්මන් මළුව ගොඩනැගීම අප සාමාජික සාමාජිකාවන්ගේ හා අනෙකුත් කමිටුන්හි සාමාජිකයන්ගේ දායකත්වයෙන් සිදුකරන ලදී. මෙහිදී පිළිම වහන්සේලා, බෝමළුව අවට ප්‍රදේශයේ ඇති සියළුම දෑ පවිත්‍ර කිරීම, කසල ඉවත්කිරීම හා සේදීම කරන ලදී. තවද චෛත්‍යය වටා ඇති පිළිම වහන්සේලා හා මල් ආසන සෝදා පිරිසිඳු කරන ලදී. මිට අමතරව ඉහල මාලයේ හා විහාරයේ පුස්තකාලයේ අපද්‍රව්‍ය ඉවත්කර ශුද්ධ පවිත්‍ර කිරීමද, අවට ප්‍රදේශය පවිත්‍ර කිරීමද සිදුකෙරුනි. සක්මන් මළුව ඉදිවන ස්ථානය අවට ඇති අපද්‍රව්‍ය සියල්ල ඉවත්කර පිරිසිඳු කර බිම සැකසීම, සක්මන් මළුව ඉදිකිරීම සඳහා අත්තිවාරම කැපීම, බදාම ඇනීම, ගල් හා වැලි සපයාදීමෙන් මේසන් බාස් හට සියළුම අත් උදව් සැපයීම සහ සක්මන් මළුවට වැලි පිරවීම අප සාමාජිකයින් විසින් සිදුකරන ලදී. 23/08/2015 දින පුජ්‍ය අභංගම ආනන්ද නාහිමියන්ගේ හා මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සක්මන් මළුව සඟසතු කොට පුජා කිරීම සිදුකෙරුනි.

මෙත්සවිය අනුශාසක පුජ්‍ය අභංගම ආනන්ද නාහිමියන්ගේ පැවිදි දිවියට වසර 75 ක් සැපිරීමේ උත්සවය හා සංඝික දානය වෙනුවෙන් ධර්මශාලාව පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් 03/10/2015 දින අපගේ දායකත්වයෙන් පවත්වන්නට යෙදුනි. මෙය අපගේ දෙවන ව්‍යාපෘතියයි. අසරණ සරණ, මරණයට කැපවූ සහ හිරකල සතුන් නිදහස්කිරීම සඳහා ආධාර රැස්කරගැනීම පිණිස 32 වන කණ්ඩායමේ පන්තියේ සියළුම සාමාජිකයන්ට හා අනෙකුත් මෙත්සවිය සාමාජිකයන්ට අපගේ දායකත්වයෙන් කැට පරිත්‍යාග කිරීම තෙවන ව්‍යාපෘතිය ලෙස සාර්ථකව නිමාවට පත්විය.

අප විසින් ඉදිරියේදී සෑම සිව් මසකට වරක් භාවනා පන්තිය අවසන් වන දින අටවිසි බුද්ධ පුජාව හා බෝධි පුජාව පැවැත්වීමටත්, බන්ධනාගාරගතව සිටින ළමුන් සඳහා අධ්‍යාපන හා උපදේශනමය වැඩසටහනක් පැවැත්වීමටත්, මෙත්සවිය විසින් කඳුබොඩ විපස්සනා භාවනා මධස්ථානයේ ඉදිකිරීමට භාරගෙන ඇති භාවනා කුටියේ ඉදිකිරීම් අවසන් කිරීම සඳහා අවශ්‍ය වන ඉතිරි අරමුදල් සඳහා ආධාර රැස්කිරීමේ ව්‍යාපෘති සිදුකිරීමටත්, අසරණ පවුලක් සඳහා නිවාසක් පිළිසකර කරදීම සිදු කිරීමට ද නියමිතය.

මේ දක්වා අපගේ කර්තව්‍යයන්ට තම කාලය, ශ්‍රමය හා ධනය කැපකරමින් දායකත්වය දැක්වූ සියල්ලන්ටම මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් සහ තරුණ කමිටුවේ සියළුම සාමාජිකයන් ස්තූති පුර්වකව පුණ්‍යානුමෝදනා කර සිටින අතර ඉදිරියේදීත් සැමගේ දායකත්වය අපගේ කටයුතු සාර්ථක කරගැනීමට අපේක්ෂා කරමු.

**ප්‍රසාද් අබේසිංහ** - තරුණ කමිටුවේ සභාපති

# 'කාන්තා කමිටුව' ගැන වචනයක්

බොහෝ ජනයාට සෙවන සුවය සලසන මනාව අතුපතර වැඩුණු ගසක් සමඟ වැඩෙන වැලක් එම ගසට අලංකාරයක්ම වේ. මෙත් සවිය කාන්තා කමිටුවද එවැනි යයි සිතෙන්නේ පසුගිය කාලය පුරා එහි ක්‍රියාකාරීත්වය ගැන විමසා බලන විටය. විශාල සාමාජික පිරිසක් සහිත මෙත් සවිය මෛත්‍රී සංසදයේ බහුතරය කාන්තාවන් නොවේ. එහෙත් එම පිරිස යහපත් එමෙන්ම හොඳ මග පෙන්වීමක් සහිත වැඩ පිළිවෙලකට ඉත සිතින් දායක වූ පිරිසකි. රැකියාවන්හි යෙදෙන, නොයෙදන කොළඹ ආසන්නව පදිංචි සහ දුර පලාත්වල සිටින අයද ඊට ඇතුළත්ය. ඔවුන් බුද්ධිමත් පිරිසක් බව හොඳින්ම වැටහෙන නිසා එක්වී වැඩ කටයුතු කිරීම සතුටකි.

කාන්තා කමිටුවේ සාමාජිකාවන්ගේ ක්‍රියාකාරීත්වය සමහර විට, සමහර කෙනෙකුට ප්‍රදර්ශනය වනු ඇත්තේ තේපැන් සංග්‍රහයත් සමඟ විය හැකිය. නමුත් එම තේපැන් සංග්‍රහය සූදානම් කර දීමට වඩා වැඩි වැඩ කොටසක් කාන්තා කමිටුව මගින් මෙත් සවිය වැඩ සටහන්වලට සම්බන්ධව සිදු කරන බව අවධාරණය කළ යුතුය. දුර බැහැර සිට පවා පැමිණෙන සාමාජික පිරිසට සැළකිය යුතු වේලාවක් වැඩ සටහන් සඳහා ගත කිරීමේදී වෙහෙස නිවන සුළු තේ පැන් සංග්‍රහයක් ලබාදීම අප සභාපති මහාචාර්ය චන්දන ජයරත්නයන්ගේ අදහසකි. ඒ සඳහා කාන්තාවන් මූලිකත්වය ගත් අතර හැම දෙනාගේ සහයෝගය ලැබුණි. ඉදිරි කාලය සඳහා පවා මෙම සංග්‍රහයේ බරපැන දැරීමට සුලු දැනුම් දීමකින් සාමාජික පිරිස ඉදිරිපත් වීම අගය කළ යුතුය. එසේම නිරන්තරවම සභාපතිතුමන් මේ කටයුත්ත අගය කිරීම විශාල සතුටකි.

මෙත් සවිය මූලස්ථානයේ පමණක් නොව විවිධ ස්ථානවල පැවැත්වෙන වැඩසටහන් සඳහාද කාන්තා කමිටුව සිය සහයෝගය නොපැකිල දක්වයි. නායකත්වය පුහුණු වැඩසටහන, විභාග සඳහා ඉදිරිපත්වන දරුවන්ගේ මානසිකත්වය හැඩ ගස්වන වැඩසටහන සීල සමාධි වැඩ සටහන ආදී සියලුම මෙත් සවිය වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී තමන්ට හැකි පරිදි තම දායකත්වය සපයා ඇත.

ළමා නිවාස, අනාථ නිවාස වැනි ආයතන වලට ආධාර උපකාර කිරීමේ වැඩසටහන් වලට සහභාගී වීමෙන් නොනැවතුන කාන්තා කමිටුව ඉන් ඔබ්බටද ගොස් ඇත. විශේෂත්වයෙන් වැඩිහිටි නිවාස සඳහා ආහාරපාන ලබාදීමට අමතරව කාන්තා කමිටු සාමාජිකාවන් එම සමාජයේ තනිවූ පිරිස සමග මුළු දවසම වගේ ගත කරමින් ඔවුන් සතුටින් තබන්නට උත්සාහ ගනියි.

මේ සියලු වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට මෙත් සවිය කාන්තා කමිටුවට හැකිවී තිබෙන්නේ සාමාජිකාවන්ගේ සමගිය නිසාවෙනි. අප අතර තරඟකාරීත්වයක් නැත. තමන් ඉස්මතු වෙන්නට කැපී පෙනෙන්නට, නිලතල ලබා ගන්නට අප කිසිවෙකුත් උත්සාහ කරන්නේ නැත. මා කමිටුවේ සභාපති වූ පසුවද හිටපු සභාපතිතුමිය ඇතුළු සියළුම සාමාජිකාවන් කිසිදු වෙනසක් නැති බව මා සමග එක්ව කටයුතු කිරීම වාසනාවකි. මේ සහෝදරියන් පිරිස සමග අපට මග පෙන්වන අපේ ගුරු වූ මහාචාර්යතුමන්ගේ මූලිකත්වයෙන් සිදු කරන කාන්තාවන්ට පමණක් නොව සමාජයේ හැකිතරම් පිරිසකට මෛත්‍රී සිතින් යුතුව මෙත් සවිය ගෙන යන වැඩ පිළිවෙලට තවත් දිගු කාලයක් සහභාගී වීමට ලැබේවා.

**විනීතා රංජනී උඩුගොඩ** - කාන්තා කමිටු සභාපතිනි

# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2015. 08. 14 සිට 2015. 11 . 08 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. | ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 14/C-0700 | ලක්ෂ්මි තිලකරත්න මෙනවිය | 01/0282 | 500 | 14/A/3089/3100 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 1,200 |
| 14/A/3134/3140 | ප්‍රදීප් යහම්පත් මයා. | 15/2636 | 700 | 14/A/3112/3125 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 1,400 |
| 14/D/0244 | ජයන්ත සරත් දිසානායක මයා. | | 1,000 | 14/A/3208/3225 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 1,800 |
| 14/A/4885/4900 | ජී.ඒ.එම්.සිල්වා මයා. | 31/4847 | 1,600 | කැට 0529 | එම්.ඒ.කරුණාවතී මිය. | 32/4881 | 2,000 |
| 14/A/10502/10525 | විශාකා සුදර්ශනී මිය. | 31/4816 | 2,400 | 14/A/3181/3200 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 2,000 |
| 14/A/10976/11000 | ඩී.ජී.ටී.චමින්ද මයා. | 31/4721 | 2,500 | 14/C/0263/0267 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 2,500 |
| 14/A/5826/5850 | අජිත් සුදත්සන මයා. | 12/2099 | 2,500 | 14/A/9351/9375 | ඒ.පී.තිෂල් මයා. | 31/4754 | 2,500 |
| 14/A/10451/10475 | තේජා හපුආරච්චි මිය. | 31/4765 | 2,500 | 14/D/0188/0190 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 3,000 |
| 14/A/6376/6400 | රුසිරු තක්ෂිල මයා. | 31/4819 | 2,500 | 14/A/15926/15975 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 5,000 |
| 14/A/10101/10125 | එස්.රාජපක්ෂ මිය. | 31/4832 | 2,500 | 14/E/0024 | පියසීලි දහනායක මිය සහ | | |
| 14/A/10826/10850 | ලලිත් සුනන්ද මයා. | 14/2440 | 2,500 | | තුෂාරි දහනායක මිය. | | 5,000 |
| කැට 0527 | රන්ජිත් දිසානායක මයා. | | 2,500 | 14/E/0025 | රම්‍යා සිරිමතී මිය. | 32/4882 | 5,000 |
| 14/A/9876/9925 | ප්‍රසන්න කුමාර ධර්මසේන මයා. | 31/4823 | 5,000 | කැට 0292/0293 | ප්‍රදීප් මයා. / මහියංගනය | | 6,990 |
| 14/E/0022 | චාන්දනී වීරසේකර මිය. | | 5,000 | 14/A/15776/15875 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 10,000 |
| 14/E/0023 | සුමනා කරුණාසේන මිය. | 27/4084 | 5,000 | Donation/Till Collection | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 14,661 |
| 14/ B/726/750 | එස්.එස්.සුවාරිස් මිය. | 30/4551 | 6,250 | කැට 0288/291 | ප්‍රදීප් මයා. / මහියංගනය | | 15,520 |
| 14/ B/451/475 | වයලට් සෙනවිරත්න මිය. | 30/4689 | 6,250 | 14/A/14076/15675 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 160,000 |
| කැට 0286/0287 | ප්‍රදීප් මයා. / මහියංගනය | | 7,210 | 527 | චන්ද්‍ර චිත්‍රානි අබේරත්න මිය සහ | 7/2564 | |
| 14/F/0054 | දිලිනි ගුණතිලක මිය සහ | 31/4747 | | | අබේරත්න බණ්ඩාර මයා. | 7/2565 | 200,000 |
| | ලංකා සමරකෝන් මිය. | 31/4746 | 10,000 | 14/ C/0268 | රෂිනි විද්‍යනිකා මෙනවිය. | | 500 |
| කැට 0282/0285 | ප්‍රදීප් මයා. / මහියංගනය | | 10,927 | 14/B/0176/0184 | කේ.පී.එම්.පතිරණ මයා. | 29/4531 | 2,250 |
| 14/C/0576/0600 | ධම්මිකා නාලනී මිය. | 31/4766 | 12,500 | 14/A/5601/5625 | එච්.පියසීලි මිය. | 06/1077 | 2,500 |
| 14/C/0176/0200 | වයලට් සෙනවිරත්න මිය. | 30/4689 | 12,500 | 14/A/6476/6500 | ඩී.ඒ.වික්‍රමසිංහ මිය. | 27/4098 | 2,500 |
| 14/ C/0262 | චාමර ප්‍රසාද් මයා. | 32/4955 | 500 | 528 | සජිත් නානායක්කාර මයා. | | 3,000 |
| 14/ D/0186 | ශ්‍යාමලී කුමාරි ප්‍රේමරත්න මිය. | 27/4166 | 1,000 | Old Book / Rs.100 II | | | |
| කැට 0528 | සුමනා ප්‍රේමරත්න මිය. | 20/3258 | 2,000 | / 10351 / 10400 | | | |
| 14/A/1226/1250 | තුෂාන් බණ්ඩාර මයා. | 29/4409 | 2,500 | | කපිල සෙනරත් කුමාර මයා. | 12/2215 | 5,000 |
| 14/A/051/075 | එච්.බී.දිසානායක මයා. | 29/4489 | 2,500 | 14/D/0001/0006 | කේ.පී.එම්.පතිරණ මයා. | 29/4531 | 6,000 |
| 14/A/6576/6600 | ජානකි පෙරේරා මෙනවිය. | 31/4801 | 2,500 | 14/B/0176/0184 | සමන්ති නිලන්ගනී මිය. | 27/4219 | 12,500 |
| 14/A/4176/4200 | බී.එම්.ශ්‍යාමලී මෙනවිය. | 30/4653 | 2,500 | 14/A/1036 | පියසීලි දහනායක මිය සහ | | |
| 14/A/1176/1200 | සුනිල් පුංචිහේවා මයා. | 29/4449 | 2,500 | | ලීලා පෙරේරා මිය. | | 100 |
| 14/A/6251/6275 | නිරෝෂා වීරසිංහ මිය. | 31/4711 | 2,500 | 14/C/0269 | පියසිරි ද අල්විස් සමරසිංහ මයා. | | 500 |
| 14/A/4351/4375 | ලීලා සමරතුංග මිය. | 30/4641 | 2,500 | 14/C/0270 | පියුමි දිසානායක මිය. | 32/4904 | 500 |
| 14/A/9851/9875 | ප්‍රසාද් අබේසිංහ මයා. | 27/4130 | 2,500 | 14/C/0271 | උපේකා දිසානායක මිය. | | 500 |
| 14/A/10876/10900 | අසේල නලින්ද මයා. | 31/4749 | 2,500 | 14/C/0272 | රත්නා ගමගේ මිය. | 32/4886 | 500 |
| 14/A/4801/4825 | හර්ෂනී රත්නතිලක මිය. | 28/4380 | 2,500 | 14/C/0273 | රත්නා ගමගේ මිය. | 32/4886 | 500 |
| 14/A/3551/3575 | එස්.පියුමලී මිය. | 30/4655 | 2,500 | 14/A/1026/1035 | නයනා සිරිවර්ධන මෙනවිය. | 25/3890 | 1,000 |
| 14/A/4326/4350 | ප්‍රෙමිලා ජයවර්ධන මිය. | 30/4656 | 2,500 | 14/ D/0245 | ඩබ්.ඒ.ජමින්ද්‍රනාත් මයා. | 32/4892 | 1,000 |
| 14/A/13526/13550 | දිමුතු ලැනරෝල් මයා. | 31/4698 | 2,500 | කැට 0531 | සචිනා මුතුකුමාරණ මිය. | | 1,000 |
| 14/A/5076/5100 | රම්‍යා කුමුදනී මිය. | 30/4651 | 2,500 | 14/A/3951/3975 | දිලිනි අනුරුධිකා මිය. | 30/4569 | 2,500 |
| 14/A/10226/10250 | ජී.ඩී.කේ.විජේසේකර මිය. | 31/4802 | 2,500 | 14/A/10951/10975 | සී.එස්.කොඩිප්පිලි මිය. | 31/4759 | 2,500 |
| 14/E/0090 | නලින් ප්‍රියශාන්ත ජයසිංහ මයා. | | 5,000 | 14/A/3501/3525 | මංජුල නයනකාන්ත මයා. | 30/4666 | 2,500 |
| 14/B/676/700 | ඩබ්.සී.කොඩිතුවක්කු මයා. | 06/1165 | 6,250 | 14/A/2326/2350 | පද්මිණී විජේසිංහ මිය. | 29/4499 | 2,500 |
| 14/D/0187 | චූල මෙත්ත විජේසිරි මයා. | 31/4790 | 1,000 | 14/A/13726/13750 | අනුරාධි හපුතන්ත්‍රී මිය. | 32/4910 | 2,500 |
| 14/A/3141/3150 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 1,000 | 14/A/9426/9450 | පී.පී.කේ.යසවතී මිය. | 28/4143 | 2,500 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A/10751/10775 | එච්.දිල්රුක්ෂි මිය. | 31/4830 | 2,500 |
| 14/A/6226/6250 | ධනුෂ්ක වීරසේකර මයා. | 31/4713 | 2,500 |
| 14/A/4501/4525 | ජී.ඩී.රන්ජිත් මයා. | 29/4446 | 2,500 |
| 14/A/13876/13900 | සන්ධ්‍යා පීරිස් මිය. | 32/4967 | 2,500 |
| 14/A/10626/10650 | එස්.ජී.එන්.ඩී.සේනානායක මිය. | 31/4783 | 2,500 |
| 14/A/9401/9425 | මාලනි විදානගමගේ මිය. | 31/4844 | 2,500 |
| 14/A/10576/10600 | පූර්ණිමා සඳමාලී මිය. | 30/4643 | 2,500 |
| 14/A/6276/6300 | බුද්ධික සුසන්ත මයා. | 31/4787 | 2,500 |
| 14/A/10051/10075 | වසන්ත පුෂ්පකුමාර මයා. | 30/4692 | 2,500 |
| 14/A/9601/9625 | බී.ඩබ්.හර්ෂනී මිය. | 30/4647 | 2,500 |
| 14/A/9262/9650 | එම්.එම්.කුඹුකගේ මයා. | 30/4648 | 2,500 |
| 14/A/10301/10325 | ඉනෝකා දිල්රුක්ෂි මිය. | 31/4831 | 2,500 |
| 14/A/10951/10995 | ලාල් රූපසිංහ මයා. | 03/611 | 2,500 |
| 14/A/15676/15725 | නිලංගනී මිය. | 32/4938 | 5,000 |
| 14/B/0226/250 | ආශා අල්විස් මිය. | 29/4426 | 6,250 |
| 14/D/076/100 | මධුරිත රාජපක්ෂ මයා. | 23/3590 | 12,500 |
| 14/G/0011 | චින්තක යුරාජ් බණ්ඩාර මයා සහ | 18/3028 | |
| | මිහිරි ගුණවර්ධන මිය. | 29/4524 | 100,000 |
| 14/G/0012 | ආර්.නන්දාවතී මිය. | 22/3495 | 100,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/G/0013 | ඉන්ද්‍රානි සිරිවර්ධන මිය සහ | | |
| | නයනා සිරිවර්ධන මෙනවිය. | 25/3890 | 100,000 |
| 14/G/0014 | ජේ.දයාසිලි මිය. | 19/3098 | 100,000 |
| 14/G/0030 | හේමන්ති පෙරේරා මිය. | 30/4613 | 100,000 |
| 14/C/0274 | දිමුතු ලැනරෝල් මයා. | 31/4698 | 500 |
| 14/D/0171/180 | ටී.ජී.ඩබ්.රණසිංහ මිය. | 30/4585 | 10,000 |
| 14/D/0055 | කේ.ඩී.ඩබ්.අමරකෝන් | 06/1139 | 10,000 |
| කැට 0533 | ශෂික නවරත්න මයා. | 32/4901 | 800 |
| කැට 0534 | ඒ.එන්.පී.මෙන්ඩිස් මයා | 03/0686 | 1,500 |
| කැට 0532 | කේ.එච්.ජයලත් මිය. | | 2,500 |
| 14/A/5401/5425 | ඉන්ද්‍රානි සිල්වා මිය | 30/4549 | 2,500 |
| 14/A/17276/17300 | මාලනි හේමලතා මිය. | 31/4774 | 2,500 |
| 14/A/13551/13575 | දිමුතු ලැනරෝල් මයා. | 31/4698 | 2,500 |
| 14/A/16251/16275 | ධම්මිකා කත්‍රිආරච්චි මිය. | 32/4908 | 2,500 |
| 14/A/5976/6025 | ටී.ජී.ඩබ්.රණසිංහ මිය. | 30/4585 | 5,000 |
| 14/A/5971/5975 | ලක්මිණි කුමාරි මිය | 28/4251 | 2,500 |
| 14/A/17301/17325 | ජමින්ද්‍රනාත් වෙත්තසිංහ | 32/4892 | 2,500 |
| 14/G/0016 | උදයානි ජයසූරිය මිය | 12/2064 | 100,000 |
| 14/G/0015 | ශිලා චන්ද්‍රසෝම මිය. | 32/4897 | 100,000 |

# 'වෙබ් කමිටුව' ගැන වචනයක්

## නව විද්‍යුත් කෙටි පණිවිඩ ක්‍රමය




මෙත් සවියේ ක්‍රියාකාරකම් ගැන ඉතා ඉක්මනින් එහි සාමාජිකයන්ව දැනුවත් කිරීමේ අරමුණින් ඉලෙක්ට්‍රොනික කෙටි පණිවිඩ ක්‍රමයක් (eSMS) ස්ථාපනය කරන ලදී. මෙම පද්ධතියෙහි ලියා පදිංචි සියළුම සාමාජිකයන්ට එකවරම කෙටි පණිවිඩ යැවීමේ හැකියාව ඇත. මෙම පද්ධතිය සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම කණ්ඩායම් අනුක්‍රමයෙන් සිදුකරමින් පවතී. ඔබට ඉක්මනින් මෙහි සාමජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය නම්,

**methsaviya.editor@gmail.com** වෙත

ඔබගේ සාමාජික අංකය සහ ජංගම දුරකථන අංකය විද්‍යුත් තැපැල් පණිවිඩයකින් එවා ලියාපදිංචි වන්න.

## භාවනා වැඩසටහනට පැමිණීම සටහන් කිරීම ස්වයංක්‍රීය කර ඇත




භාවනා වැඩසටහනට පැමිණීමේ සටහන් ගැනීම ඇඟිලි සලකුණු හඳුනා ගැනීමේ යන්ත්‍රයක් (Finger Print Scanner Machine) මගින් ස්වයන්ක්‍රීය කර ඇත. වැඩසටහනට පැමිණීමට බලාපොරොත්තු වන සාමජිකයන් කලින් කාර්යාලයෙහි ලියාපදිංචි විය යුතු අතර ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ලියාපදිංචි කිරීම ඊට පසුව සිදු කරනු ලබයි. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කණ්ඩායම් වල සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ කටයතු සිදුකර ඇත. මෙයට අදාලව අනෙක් සාමාජිකයන්ගේ දත්ත එකතු කිරීම සහ පරිගණක ගත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

රැකියා පියස

# මෙත් සවිය

## යහපත් දිවිපෙවතක් සඳහා පරෝපකාරයේ මෙත් මග




මෙත්සවිය සාමාජික සාමාජිකාවන් අතුරින් රැකියා බලාපොරොත්තුවෙන් සිටින සහ රැකියා ස්ථානය මාරු කිරීමට බලාපොරොත්තුවෙන් සිටින සාමාජිකයින් හට උපකාර කිරීමේ මහගු අරමුණින් මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ උපදෙස් මත රැකියා පියස වැඩසටහන ක්‍රියාත්මකවේ. මෙම වැඩසටහන තුලින් බලාපොරොත්තුවන අභිලාෂයන් වනුයේ,

- **සුදුසුකම් සහිත සාමාජිකයින් යහපත් ස්ථාවර ආයතනයන්හි පවතිනා පුරප්පාඩු සඳහා යොමුකිරීම.**
- **ගුණගරුක කාර්යක්ෂම ශ්‍රමිකයන් බලාපොරොත්තුවන ආයතනවලට තෝරාගැනීමට සුදුසු රැකියා අපේක්ෂකයින්ගේ අයදුම් පත් යොමු කිරීම.**
- **නවක රැකියා අපේක්ෂකයින්ට රැකියා මාර්ගෝපදේශකත්වයක් ලබා දීම.**

මෙම සේවාව සම්පූර්නයෙන්ම නොමිලේ දෙන බැවින්, ඉහත අරමුණු සඳහා අප දරණ ප්‍රයාත්නයට ඔබට ද දායකත්වයක් ලබාදිය හැක. ඒ සඳහා,

- **ඔබ ආයතනයේ හෝ ඔබ දන්නා වෙනත් ආයතනයක පවතින පුරප්පාඩු පිළිබඳ තොරතුරු අපට ලබාදීමෙන්**

**හෝ**

- **ඔබ රැකියා අපේක්ෂාවෙන් සිටින්නේ නම් ඔබගේ තොරතුරු අපට ලබාදීමෙන්ද**

දායක විය හැක. තවද විශේෂයෙන්ම මෙම වැඩසටහන පවත්වාගෙන යෑමට අවශ්‍ය ශ්‍රම දායකත්වයෙන්ද ඔබට මේ සඳහා දායක විය හැක. තව කෙනෙකුගේ රැකියා අවශ්‍යතාවයක් සපුරා ගැනීමට සුළු අයුරින් හෝ උපකාර කිරීම මහගු පුණ්‍ය කර්මයක් වන නොඅනුමානය.

මෙම සේවාවට ඔබගේ දායකත්වය ලබාදීමට හෝ විස්තර සඳහා,

**දුරකථන අංක 0718 11 44 77 හෝ 0715 295 855**

අංක භාවිතා කල හැක. සෑම ඉරිදාවකම ප.ව 1.00 සිට 2.00 දක්වා අප කණ්ඩායම වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී ද හමුවිය හැක.

තෙරුවන් සරණයි...



# දෙතිස් ලකුණින් හෙබිවන බුදුහුණු

තථාගතයන් වහන්සේගේ ශ්‍රී දේහය මහා පුරුෂ ලක්ෂණ දෙතිසකින් (32 කින්) සමන්විත බව බොහෝ දෙනා අසා දැනගෙන ඇත. එහෙත් එය ඇසූ සැනින් අපට සිහි වන්නේ කයේ යම් විශේෂත්වයක් පමණි. එම එක් එක් මහා පුරුෂ ලක්ෂණයෙන් පෙර සසරේ වැඩූ විශේෂ ගුණ සමූහයක් කියැවෙන බව බොහේ දෙනා නොදනිති. යමෙකුට බුදු රුවක් දෙස බලාගෙන හෝ වනසින්ම හෝ එම එක් එක් පුරුෂ ලක්ෂණය ලැබීම සඳහා බෝසත් අවදියේදී පුරන ලද සුචරිත වර්ධනයත් මෙලොව පරලොව සැපයට හේතු වෙනවා මෙන්ම නිවන් අවබෝධය පිණිස පූර්ව ප්‍රතිපදාවද වේ. එහෙයින් බුදුරජාණන් වහන්සේ විසින්ම ලක්ඛණ සූත්‍රයේ (දීඝ නි.3) දක්වා ඇති ආකාරයට එම දෙතිස් මහා පුරුෂ ලක්ෂණත්, ඒවා ලැබීමට හේතු වූ කුසලකර්මයන් හා ඒවායේ විපාකත් මෙතැන් සිට කෙටියෙන් දක්වනු ලැබේ.

## සුප්පතිට්ඨිත පාද ලක්ෂණය

පෙර භවයන්හිදී කුසලධර්මයන්හි දැඩිව පිහිටීම, නොසැලෙන ලෙස සුචරිත ධර්මයන්හි සමාදන්වීම, කාය සුචරිතයෙන්, වාග් සුචරිතයෙන්, මනඃ සුචරිතයෙන් යුක්ත වීම, තමාට ලැබෙන දේ අන් අය සමග බෙදාගෙන වැළඳීම, පංචසීලය හා පොහෝ දින පෙහෙවස් සමාදන් වීම, මව්පිය, වැඩිහිටි, මහණ බමුණු ආදීන් කෙරෙහි ගෞරවයෙන් සත්කාර කිරීම යන කුසලකර්මයන් නැවත නැවත කළ බැවින්, එම කුසල් උත්සන්න බැවින් අප්‍රමාණ බැවින් මරණින් මතු යහපත් ගති ඇති දෙව් ලොව උපදියි. එහිදී එම මහා පුරුෂයා දිව්‍යමය ආයුෂයෙන්ද, පැහැයෙන්ද, සැපයෙන්ද, යසසින්ද, අධිපති භාවයෙන්ද, රූපයෙන්ද, ශබ්දයෙන්ද, සුගන්ධයෙන්ද, රසයෙන්ද, ස්පර්ශයෙන්ද යන කරුණු දහයෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. හෙතෙම දෙව්ලොවින් චුතව මනුලොව උපදිනුයේ "**සුප්‍රතිෂ්ඨිත පාදතා**" නැමැති මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි. එනම් මනාව පිහිටි පා ඇත්තේ වෙයි. බිම සම ලෙස පා තබයි. සම සේ පා නගයි. යටි පතුල සමව බිම පිහිටයි.

මෙම මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වූ පුරුෂයා, ඉදින් ගිහිගෙයි වාසය කරන්නේ වී නම්, දස කුසල ධර්මයන් ආරක්ෂා කරන, දැහැමින් රජ වූ, සතර සාගරයෙන් වටවූ සතර මහා දිවයිනටම නායක වූ, සතුරන් දිනූ, සත් රුවනින් යුක්ත වූ සක්විති රජෙක් වෙයි.

පෙර භවයන්හි කරන ලද එම කුසල කර්මයන්ගේ විපාක වශයෙන් කිසියම් මිනිස් සතුරෙකු විසින් මොහු යටපත් කළ නොහැකි වෙයි. හෙතෙම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම්, සියළු කෙළසුන් ප්‍රහාණය කොට සම්මා සම්බුද්ධත්වයට පැමිණෙයි. බුදු වූ උන්වහන්සේ එම කුසලයාගේ විපාක වශයෙන් කිසිම සතුරෙකු විසින් මැඩ පැවැත්විය නොහැකි වේ. මහණ, බමුණු, දෙවි, බඹු, මරු යන කිසිවකු විසින් හෝ රාග ද්වේශ මෝහයෙන් හෝ යටපත් කළ නොහැකිවේ.

## පාදතලයන්හි චක්‍ර ලක්ෂණය

පෙර භවයන්හිදී අන්‍යයන්ට පැමිණෙන සොර සතුරු බිය හා උපද්‍රව වළකමින් බොහෝ දෙනාට සුව පහසුව සැලසීම, බෝහෝ දෙනා සහභාගී කරවාගෙන දන්දීම යන කුසල කර්මයන් නැවත නැවත සිදු කිරීමෙන් හා එම කුසලයාගේ උත්සන්න භාවයෙන් මරණින් මතු දෙව්ලොව ඉපිද දිව්‍යමය වූ ආයු. වර්ණ ආදී දස කරුණින් අන්‍ය දෙවියන් අභිබවා සිටී. හෙතෙම දෙව්ලොවින් චුතව මනුලොව උපදිනුයේ **"පාද තලයෙහි චක්‍ර ලක්ෂණ පිහිටීම"** නම් වූ මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි. එනම් යටි පතුලෙහි දහසක් දැව ඇති මනාව පිහිටි චක්‍ර ලක්ෂණ පිහිටීමයි.

හෙතෙම ඉදින් ගිහි ගෙයි වාසය කරන්නේ වී නම් සක්විති රජ වෙයි. පෙර භවයන්හි කරන ලද එම කුසලයාගේ විපාක වශයෙන් විවිධ වූ මහා පිරිවර ඇත්තේ වෙයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියළු කෙළෙසුන් නසා සම්බුද්ධත්වයට පැමිණෙයි. එම කුසල විපාක වශයෙන් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, දෙවි, මිනිස්, ඇසුර, නාග, ගාන්ධර්ව ආදී මහා පිරිවර ඇති වෙයි.

## ආයතපණ්හිතාදී ලක්ෂණ තුන

පෙර භවයන්හිදී ප්‍රාණ ඝාතයෙන් වැළකීම, ආයුධ දඬුමුගුරු ආදියෙන් සත්වයන්ට හිංසා නොකිරීම, ප්‍රාණඝාතය කෙරෙහි ලජ්ජා ඇතිබව, සියළු සත්වයන් කෙරෙහි දයාවෙන් හා හිතානුකම්පාවෙන් යුක්ත වීම යන කුෂලකර්මයන් නැවත නැවත සිදු කිරීමෙන් හා එම කුසලයන්ගේ උත්සන්න භාවයෙන් මරණින් මතු දෙව් ලොව ඉපිද ආයු වර්ණාදී කරුණු දහයෙන් අන් දෙවියන් අභිබවා සිටියි. හෙතෙම දෙව්ලොවින් චුතව මනුලොව උපදින කල්හි **"දිග විලුඹ ඇති බව, දිග ඇඟිලි ඇතිබව, සෘජු ශරීර ඇතිබව"** යන මහා පුරුෂ ලක්ෂණ තුන ඇතිව උපදී.

හෙතෙම ගිහිගෙයි වාසය කරන්නේ නම් සක්විති රජ වී පෙර භවයන්හි කරන ලද කුසල විපාක වශයෙන් දීර්ඝායු ලබයි. මනුෂ්‍ය වූ කිසිවෙකුට ඔහුගේ ජීවිතය අකාලයේ විනාශ කිරීමට නොහැකි වෙයි. ඉදින් ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුද්ධත්වයට පැමිණ දීර්ඝායු ලබයි. මහණ, බමුණු, දෙවි, බඹු, මරු ආදී කිසිවෙකු විසින් අකාලයේ දිවි තොර කරන්නට නොහැකි වෙයි.

## සත්තුස්සද ලක්ෂණය

පෙර භවයන්හිදී ප්‍රණීත වූ රසවත් වූ ආහාර පානාදිය දන්දීම නැවත නැවත සිදු කිරීමෙන් හා එම කුෂලකර්මයේ උත්සන්න භාවයෙන් මරණින් මතු දෙව් ලොව ඉපිද ආයු වර්ණාදී දස කරුණින් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **"සත් තැනෙක පිරුණු මස්පිඩු ඇති බව"** නැමැති මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි. එනම් පිට් අත්ල දෙක, පිටිපතුල් දෙක, උරහිස් දෙක සහ බෙල්ල යන සත් තැන මනාව පිරුණු මස්පිඩු ඇති වෙයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවී පෙර භවයන්හි කරන ලද එම කුසලයාගේ විපාක වශයෙන් ප්‍රණීත වූ ආහාර පානාදිය ලබයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ප්‍රණීත වූ, රසවත් වූ ආහාර පානාදිය ලබයි.

## කරචරණ මෘදුතාදී ලක්ෂණ දෙක

පෙර භවයන්හිදී දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාවට සංග්‍රහ කිරීමේ කුසලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදී දස කරුණින් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **"මොලොක් අතුල් පතුල් ඇතිබව, දැල් කවුළුවකට බඳු අත්පා ඇති බව"** යන මහා පුරුෂ ලක්ෂන දෙක ඇතිව උපදී. (මෙහි ''දැල් කවුළුවක් බඳු අත්පා'' යනු අත්පා වල ඇඟිලි දිගින් එක මට්ටමක පිහිටා ඇති බැවින් ඇඟිලි පුරුක් එක කෙලින්ම පිහිටීම නිසා කොටු ගැසුවාක් මෙන් පෙනෙන ලක්ෂණයයි)

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවී අනෙකුත් රජවරුන් ඇතුළු සියළු පිරිවර ජනයාට සතර සංග්‍රහ වස්තුවෙන් මනාව සංග්‍රහ කරයි. (එහෙයින් එම පිරිවර කිසිදා රජුගේ අණ නො ඉක්මවති.) ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, දෙවි, මිනිස් ඇසුර, නාග, ගාන්ධර්ව ආදී සියළු පිරිසට ධර්මයෙන් මනාව සංග්‍රහ කරයි.

## උත්සංඛපාදාදී ලක්ෂණ දෙක

පෙර භවයන්හිදී බොහෝ දෙනා දශ කුෂලකර්ම පථයන් වෙත යොමු කරවීම, දෙලොව යහපතට මග පෙන්වීම, සියළු දෙනාට ධර්මය කියාදීම (ධර්ම දානය) යන කුසල කර්මයන් කිරීමෙන් දෙව් ලොව ඉපිද ආයු වර්ණාදී දස කරුණින් අන්‍ය දෙවියන් අභිබවා සිටී, මනු ලොව උපදින කල්හි ඉහලින් පිහිටි ගොප් ඇට සහිත පා ඇති බව, ලෝමයන් දකුණට කරකැවී අග්‍රය උඩුකුරුව ඇති බව යන මහා පුරුෂ ලක්ෂණ දෙක ඇතිව උපදී. (පාදයේ වලලුකරට ඉහලින් ඇති ගොප් ඇටය අන්‍යයන්ට වඩා ඉහලින් පිහිටා ඇති බැවින් පතුල පහසුවෙන් ක්‍රියා කරවිය හැකිය. පියවර තබද්දී යටිපතුල පසුපසට පමණක් නොව ඉදිරියටද දර්ශනය වේ.

හෙතෙම ගිහිව වාසය කරයි නම් සක්විති රජවී ලෞකික සැප විඳින්නවුන්ට අග්‍රවෙයි. ශ්‍රේෂ්ඨ වෙයි. ප්‍රමුඛ වෙයි. උත්තම වෙයි. ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී සියළු සත්වයින්ට අග්‍ර වෙයි. ශ්‍රේෂ්ඨ වෙයි. ප්‍රමුඛ වෙයි. උත්තම වෙයි.

## ඒණිජංගා ලක්ෂණය

පෙර භවයන්හිදී අන් අයට විද්‍යාවෙන් හා ශිල්ප සංවරය හා ප්‍රඥාවද පුහුණු කරවමින් ජනයාගේ යහපත සුවය හා අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීමේ කුසලයෙන් දෙව් ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනු ලොව උපදින කල්හි **"මනාව පිහිටි කෙණ්ඩා ඇති බව"** නැමැති මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි.

හෙතෙම ගිහිගෙයි වාසය කරයි නම් සක්විති රජ වී ඇත්, අස්, රිය, පාබල යන සේනාවද, උසස් වූ යාන වාහනද, සියළු උපභෝග පරිභෝග වස්තූන් ද වහා ලබයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ශ්‍රමණයන්ට උචිත වූ උපභෝග පරිභෝග වස්තූන් යම්තාක් වෙත්ද, ඒ සියල්ල මැනැවින් ලබයි.

## සුඛුමජවි ලක්ෂණය

පෙර භවයන්හිදී ශ්‍රමණයන් වෙත බ්‍රාහ්මණයන් වෙත ගොස් කුසල්-අකුසල්, යහපත-අයහපත, වැඩ-අවැඩ, සේවනය කලයුතු නොකලයුතු ධර්මයන් පිළිබඳව නැවත නැවත විචාරා දැන ගැනීමේ කුසලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදී දස කරුණින් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි "**සිනිඳු සම ඇති බව**" නැමැති මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි. සිනිඳු සම ඇති හෙයින් දූවිලි, කිළුටු ආදිය කයෙහි නො ඇලෙයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරන්නේ නම් සක්විති රජවී මහා ප්‍රඥාව ඇත්තෙක් වෙයි. ලෞකික සැප විඳින්නවුන් අතර ප්‍රඥාවෙන් ඔහුට සමාන වූවෙක් හෝ වැඩි වූවෙක් හෝ නැත. ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී මහා ප්‍රඥා ඇත්තේ වෙයි. සියළු නාම රූප ධර්මයන් විනිවිද දකින මහා ප්‍රඥා ඇත්තේ වෙයි. සියළු සත්වයන් අතර ප්‍රඥාවෙන් වැඩි කෙනෙක් තබා උන්වහන්සේට සම කෙනෙක් හෝ නොවෙති.

## ස්වර්ණ වර්ණතා ලක්ෂණය

පෙර භවයන්හිදී නොකිපීම, කොතරම් දෝෂාරෝපණයක දී වුවත් ක්‍රෝධ නොකිරීම, අන්‍යයන්ගේ වරදෙහිදී නොකිපීම හා නොසතුට ඇති නොකරගැනීම, සෞම්‍ය වූ මෙළොක් වූ සැප පහසු වස්ත්‍ර, ඇතිරිලි, පළස් ආදිය පූජා කිරීම යන කුසලයන්ගේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මිනිස් ලොව උපදින කල්හි "**රන්වන් පැහැය ඇති බව**" නම් වූ මහා පුරුෂ ලක්ෂණය ලබයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජ වී සෞම්‍ය වූ මොළොක් වූ උතුම් වූ වස්ත්‍ර පිළි, ඇතිරිලි, පලස් ආදිය ලබයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී සෞම්‍ය වූ මොළොක් වූ උතුම් වූ සිවුරු, අතිරිලි, පලස් ආදිය ලබයි.

## කෝසෝහිත වත්ථගුය්හතා ලක්ෂනය

පෙර භවයන්හිදී ඔවුන්නොවුන් වෙන්ව සිටී. ඔවුනොවුන් විරසකව සිටී. බොහෝ කලක් දුරස්ථව සිටි යහළු මිත්‍රයන්ද, සොහොයුරු සොහොයුරියන්ද, මව්පිය දූදරු ආදීන්ද එකතු කොට සමගි කොට සතුටු විය. ඒ කුසලයෙන් දෙව් ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි " **කෝසෝහිත වත්ථගුය්හ**" නම් මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි. එනම් පුරුෂ ලිංගය, ඇතුන්ගේ මෙන් කෝෂයක් තුල පිහිටීමයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවී, ශූර වීර වූ සතුරු සේනා මඩින්නට සමත් වූ, ප්‍රිය වචන කථාකරන්නා වූ දහසකට වැඩි පුත්‍රයෝ ලබයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ශූර වීර වූ, දහමින් සතුරන් මඩින්නට සමර්ථ වූ, අවවාදය පිළිපදින දහස් ගණන් ශ්‍රාවක පුත්‍රයෝ ලබයි.

## පරිමණ්ඩලතාදී ලක්ෂණ දෙක

පෙර භවයන්හිදී මහජනයාට සමව සංග්‍රහ කිරීම, ඒ ඒ පුරුෂයාගේ ශක්තිය දැන හඳුනාගෙන සුදුසු කටයුතු පමණක් පැවරීම, ජනතාවගේ වෙහෙස මහන්සිය හඳුනාගෙන ඊට සරිලන ලෙස කටයුතු සංවිධානය කිරීම ආදී කුෂලකර්මයන්ගේ බලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන් දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි "**ආරෝහ පරිනාහ දේහ සම්පත් ලැබීම. නොනැමී දෙදන ස්පර්ශ කළ හැකි බව**" නම් වූ මහා පුරුෂ ලක්ෂණ දෙකින් යුක්ත වෙයි.

හෙතෙම ගිහිගෙයි වාසය කරයි නම් සක්විති රජවී ධන ධාන්‍ය, රන් රිදී මුතු මැණික්, උපභෝග පරිභෝග වස්තූන්ගෙන් ආඪ්‍ය වෙයි. පිරුණාවූ හිස් නොවන ගබඩා ඇත්තේ වෙයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ශ්‍රද්ධා, සීල, හිරි, ඔත්තප්ප, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන සප්ත ආර්ය ධනයෙන් පරිපූර්ණ වෙයි. ශ්‍රමණයෙකුට සුදුසු වූ උපභෝග පරිභෝග සම්පත් නො අඩුව ලබයි.

## සිංහපූර්වාර්ධකාය ආදී ලක්ෂණ තුන

පෙර භවයන්හිදී අන්‍යයන්ගේ යහපත, සුවපහසුව අපේක්ෂා කරමින්, ඔවුන් නොපිරිහී සමෘධිමත් කරනු පිණිස වෙහෙසී ක්‍රියා කිරීම, බාහිර සම්පතින් මෙන්ම ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන යහ ගුණවලින් පෝෂණය කරන්නට වෙහෙසීම යන කුසලබලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි "**ශක්තිමත් පිරිපුන් කය ඇති බව, මසින් පිරුණු පිටිකර ඇතිබව, සමව වට වූ කඳ ඇති බව**" යන මහා පුරුෂ ලක්ෂණ තුන ලබයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවී ධන ධාන්‍ය, කෙත්වතු, දෙපා සිවුපා සතුන්, අඹුදරු, දැසිදස්, නෑදෑ හිතමිතුරු ආදී සියළු සම්පතින් පරිපූර්ණ වෙයි. කිසිදා එම සම්පත් නොපිරිහෙයි. ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන පඤ්ච ධර්මයෙන් පරිපූර්ණ වෙයි. සියළු සැපයෙන් සම්පූර්ණ වෙයි. එම සැපය කිසිදා නොපිරිහෙයි.

## රසග්‍රසාග්‍රතා ලක්ෂණය

පෙර භවයන්හිදී අවි ආයුධ, දඬු මුගුරු, කැට කැබලිති ආදියෙන් කිසිම සත්වයෙකුට හිංසා පීඩා නොකිරීමේ කුසලයෙන් දෙව් ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි ''අග්‍ර රස මතුකර දෙන රස නහර ඇති බව'' නැමැති මහා පුරුෂ ලක්ෂණය ලබයි. එනම් ග්‍රීවයෙහි උඩුකුරුව කෙළින් පිහිටි, සමව රස මතුකරන රස නහර ඇති බවය.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවී නිදුක්ව, නිරෝගීව වාසය කරයි. උණුසුම හා සිසිලස සම වූ කර්මජ තේජෝ ධාතුවෙන් යුක්ත වෙයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ඉතා උෂ්ණද නොවූ ඉතා සීතද නොවූ, වීර්ය වඩන්නට යෝග්‍ය වූ කර්මජ තේජෝ ධාතුවෙන් යුක්ත වෙයි. නිදුක් බව නිරෝගී බව ලබයි.

## අභිනීල නේත්‍රාදී ලක්ෂණ දෙක

පෙර භවයනහි කෝපයෙන් ඇස් ඔරවා නොබැලීම, ක්‍රෝධ සිතින් රහසින් අනුන් දෙස නොබැලීම, ඍජු වූ සිතින් ප්‍රිය ඇසින් අනුන් දෙස බැලීම යන කුසලයාගේ විපාකයෙන් දෙව් ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටියි. මනුලොව උපදින කල්හි.

**"නිල්වන් වූ කාන්තිමත් ඇස් ඇති බව, ඔපවත් වූ මැනැවින් වටකුරු වූ දීප්තිමත් ඇස් (ගුලි) ඇති බව"** නම් වූ මහා පුරුෂ ලක්ෂණ දෙක ලබයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජව් සියල්ලන්ට මනාප වෙයි. රජවරු ඇතුළු ජනයා විසින් දැක්මට ප්‍රිය වෙයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී සියළු සත්වයින්ට ප්‍රිය වෙයි. භික්ෂු - භික්ෂුණී, උපාසක උපාසිකා, දෙව්-මිනිස්, අසුර, නාග, ගාන්ධර්ව ආදී සියළු සත්වයන්ට ප්‍රිය වෙයි.

## උණ්හීස ශීර්ෂ ලක්ෂණය

කුසල් කිරීමෙහිදී නායකත්වය ගෙන ක්‍රියා කිරීම, කාය සුචරිත, වාග් සුචරිත, මනෝ සුචරිතයෙහි අන්‍යයන්ද යොදවමින් තමන් මූලිකත්වය ගැනීම, සීල සමාදානය, මව්පිය උපස්ථානය, මහණ බමුණන් පිදීම සහ වෙනත් අධි කුෂලධර්මයන්හිදී පුරෝගාමීව ක්‍රියා කිරීමේ කුෂලබලයෙන් දෙව් ලොව ඉපිද, ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **" මනාව පිරිපුන් නළල් තලය හා ශීර්ෂය ඇති බව"** නැමැති මහා පුරුෂ ලක්ෂණය ලබයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජ වී තමන්ට අවනත වූ මහා පිරිවර ලබයි. රජ, ඇමති, සිටු, ගෘහපති, බල සේනා ඇතුළු සියළු ජනයා ඔහු ප්‍රමුඛ කොට, ඔහු අනුව යති. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී ධර්මයෙන් අවනත වූ මහ පිරිවර ලබයි. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, දෙව්, මිනිස්, අසුර, නාග, ගාන්ධර්ව ආදී සියළු සත්වයෝ උන්වහන්සේ ප්‍රමුඛ කොට ඒ අනුව යති.

## ඒකේක ලෝමතාදී ලක්ෂණ දෙක

පෙර මුසාවාදයෙන් (බොරු කීමෙන්) වැළකීම, ඇත්ත කථා කිරීම, තහවුරු වූ, ඇදහිය යුතු වූ, නොරවටන්නාවූ සත්‍ය වචන කථා කිරීම නැමැති කුසලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **"එක් එක් රෝම කූපයක, එක් එක් රෝමයක් පිහිටීම, දෙබැම අතර සුදුපැහැති ඌර්ණ රෝමයක් පිහිටීම"** යන මහා පුරුෂ ලක්ෂණ දෙක ලබයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජ වී තම අදහස් අනුව පවතින පිරිවර ලබයි. සියළු රජවරු ඇතුළු සේනාවෝද, මහජනයාද ඔහුගේ අදහස් අනුව පවතී. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී තම අදහස අනුව පවතින පිරිවර ලබයි. භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා, දෙව්, මිනිස්, ඇසුර, නාග, ගාන්ධර්ව ආදී සියළු සත්වයෝ උන්වහන්සේගේ අදහස අනුව පවතී. (සක්විති රජ වෙයි නම් ඌර්ණ රෝමය වමට කරකැවී පිහිටන බවත්, සම්මා සම්බුදු වෙයි නම් එය දකුණට කරකැවී පිහිටන බවත් ඇතැම් තැනක සඳහන් වේ. ඒ අනුව දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතර සක්විති රජවරුන් හා බුදුවරුන් අතර වෙනසක් දැකිය හැකි එකම මහා පුරුෂ ලක්ෂණය ඌර්ණ රෝම ධාතුව බව කියවේ.)

## චත්තාලීස දන්තාදී ලක්ෂණ දෙක

කේලාම් කීමෙන් වෙන්වීම, ඔවුනොවුන් බිඳවීමට ක්‍රියා නොකිරීම, අසමගි වූවන් සමගි කිරීම, සමගියට අනුබල දීම, සමගියෙහි ඇලී ඉන් සතුටුවීම, සමගියට හේතුවන වචන කීම යන කුසලකර්මයන්ගේ බලයෙන් දෙව් ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **"දත් සතලිසක් ඇති බව, දත් අතර විවර නැති බව"** යන මහා පුරුෂ ලක්ෂණ දෙක ලබයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරන්නේ නම් සක්විති රජව් කිසිවෙකු විසින් භේද නොකළ හැකි මහා පිරිවර ලබයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වී කිසිවෙකු විසින් භේද නොකළ හැකි වෙනස් නොකළ හැකි මහ පිරිස් ලබයි.

## පහූත ජිව්හතාදී ලක්ෂණ දෙක

පරුෂ වචන නොකීම, රළු වූ පරොස් බසින් වැළකීම, නිදොස් වූ කනට මිහිරි වූ, සිත්හි කාවදින්නා වූ, බොහෝ දෙනාට ප්‍රිය මනාප වචන කථා කිරීම නැමැති කුසලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **"දිගු පුළුල් දිව ඇති බව, බ්‍රහ්මස්වරය ඇති බව"** යන මහා පුරුෂ ලක්ෂණ දෙක ලබයි. බ්‍රහ්ම ස්වරය යනු අංග අටකින් යුක්ත වූ, ගැඹුරු වූ එහෙත් කුරවීක පක්ෂියෙකුගේ බඳු මිහිරි වූ ස්වරයයි. (කටහඬයි) භාෂාව කුමක් වුවත් ඕනෑම කෙනෙකුට දහම වැටහෙන පරිදි දේශනා කරන්නට (බුදුවරු) බ්‍රහ්මස්වරය භාවිතා කරති.

හෙතෙම ගිහිගෙයි වාසය කරයි නම් සක්විති රජවෙයි. අන්‍යයන් විසින් පිළිගන්නා වචන ඇත්තේ වෙයි. රජවරු ඇතුළු සියලු පිරිවර ඔහුගේ වචනය පිළිනිත්. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වෙයි. පිළිගත යුතු වචන ඇත්තේ වෙයි. භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා, දෙව්-මිනිස්, අසුර, නාග, ගාන්ධර්වාදී සියළු සත්වයෝ උන්වහන්සේගේ වචනය පිලිගනිත්,

## සීහ හනු ලක්ෂණය

සම්පප්‍රලාපයෙන් වැළකීම, අවස්ථාව දැනගෙන කථා කිරීම, සත්‍ය වූ යහපත සලසන වචනම කථා කිරීම, දහමට විනයට කුසලයට උපකාරවන අර්ථවත් වචන කථා කිරීම නැමැති කුසලයේ බලයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි

**"මනාව පිහිටි උඩු/යටි හනු ඇති බව"** නම් වූ මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වෙයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවෙයි. ධර්ම රාජ්‍යයෙහි මනාව පිහිටියේ වෙයි. මනුෂ්‍යවූ කිසිම සතුරෙකුට ඔහු එතැනින් නෙරපන්නට නොහැකි වෙයි. ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සම්මා සම්බුදු වෙයි. රාගයට හෝ ද්වේශයට හෝ මෝහයට හෝ උන්වහන්සේ බුද්ධත්වයෙන් නෙරපන්නට නොහැකි වේ. මහණ, බමුණු, දෙව්,

බඹු, මරු ආදී සත්වයෙකුට හෝ උන්වහන්සේ නෙරපන්නට නොහැකි වෙයි.

## සම දන්තාදී ලක්ෂණ දෙක

මිථ්‍යා ආජීවයෙන් තොරවීම, සම්‍යක් ආජීවයෙන් යුක්ත වීම, හොර කිරුම්, හොර මිනුම්, අල්ලස් ගැනුම්, වඤ්චා කිරීම්, පැහැර ගැනුම්, සොරා ගැනුම් ආදී සියළු පව්කම් වලින්ද, නොකළ යුතු වෙළඳාම් ආදියෙන් ද වැළකීම යන කුසලකර්මයාගේ විපාක වශයෙන් දෙව්ලොව ඉපිද ආයු වර්ණාදියෙන් අන්‍ය දෙවියන් අභිබවා සිටී. මනුලොව උපදින කල්හි **"සම දත් ඇති බව, ඉතා සුදු පැහැ දත් ඇතිබව"** යන මහා පුරුෂ ලක්ෂණ දෙකින් යුක්ත වෙයි.

හෙතෙම ගිහි ගෙයි වාසය කරයි නම් සක්විති රජවී ව්‍යාකුල නොවූ පිරිසිදු වූ පිරිවර ලබයි. ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියළු කෙළෙස් කිළුටු ප්‍රහාණය කොට සම්මා සම්බුදු වෙයි. පිරිසිදු වූ පිරිවරද ලබයි. උන්වහන්සේගේ අවවාද පිළිපදින්නාවූ බොහෝ ගිහියෝද පැවිද්දෝද, දෙව් බඹුහුද රාගාදී කෙළෙස් මළ ප්‍රහීන කොට පිරිසිදු වෙති.

**"දෙතිස් මහා පුරුෂ ලක්ෂණ"** යනුවෙන් හඳුන්වන්නේ මෙසේ අනන්ත සසරෙහි නැවත නැවත පුහුණු කළාවූ, මැනවින් සම්පූර්ණ කළාවූ සුචරිත ධර්මයන්, යහගුණ ධර්මයන්, පාරමී ධර්මයන් ඇති බව දැනගැනීමට උපකාර වන ප්‍රධාන ශරීර ලක්ෂණ තිස් දෙකකි. තවත් කුඩා කුඩා ලක්ෂණ (අනු ව්‍යඤ්ජන) අසූවක් (80ක්) ද මංගල ලක්ෂණ 108 ක්ද සම්බුද්ධ ශරීරය මතුපිට විද්‍යමාන වේ. මෙම අංග ලක්ෂණ ඇති නිසාවෙන් බුදු වූවා නොව, බුදු වෙන්නට සුදුසු ගුණ පැවති නිසාම මෙම අංග ලක්ෂණ පහළ විය. මෙම එක් එක් මහා පුරුෂ ලක්ෂණයන් පහළ වෙන්නට හේතු වූ පූර්ව කෘත කුශලධර්මයන් නැවත නැවත නුවණින් මෙනෙහි කරන්නහුට එම

**"බුද්ධගුණ ආවර්ජනය"**

**සඟ මොක් සුව ගෙනදෙන උසස් භාවනාවකි.**

---- පූජ්‍ය කුකුල්පනේ සුදස්සි හිමිගේ ලිපියක් ඇසුරිනි.



# බුද්ධ ප්‍රතිමා නෙලීම

බුදුරජාණන් වහන්සේ දැක ගැනීමට අවශ්‍ය නම් ධර්මය දැකිය යුතු බව **"යෝ ධම්මං පස්සති, සෝ මං පස්සති"** යනුවෙන් තථාගතයන් වහන්සේ දෙසූහ. එහෙත් දහම දැකීමට ප්‍රඥාව අවශ්‍යය. ප්‍රඥාව ඇති වීමට නම් ගුණ දැනගෙන ඇතිවන ප්‍රසාදය හෙවත් ශ්‍රද්ධාව අවශ්‍යය. ශ්‍රද්ධාව ඇතිවීමට නම් රතනත්‍රය වෙත යොමුවීම අවශ්‍යය. බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයෙහි උන්වහන්සේගේ බාහිර දර්ශනය බොහෝ දෙනා දහම වෙත යොමු වීමට ප්‍රබල හේතුවක් විය. නුවණ ඇති අය රූපය දුටුවත් නොදුටුවත් දහම විනිවිද බුදුන් දකින්නට සමත් වූහ. එහෙත් නුවණ මද, මනස දුබල බොහෝ දෙනා දහම් මගට යොමු කරනු පිණිස තථාගතයන් වහන්සේගේ බාහිර රූපකාය පමණක් නොව මානසික ශක්තියෙන් නිර්මිත රූපයන් පවා උන්වහන්සේ යොදා ගත්හ. මට්ඨකුණ්ඩලී වැනි ගත - සිත දුබල වූවන්ටත්, ශාක්‍යයන් වැනි මානාධිකයන්ටත්, උරුවේල කාශ්‍යප වැනි මුලා වූවන්ටත්, වක්කලී හිමියන් වැනි භක්තියෙන් අන්ධ වූවන්ටත් දහම් මග පෙන්වන්නට ස්වභාවික රූපකාය මෙන්ම නිර්මිත රූපයත් යොදාගත් අයුරු බෞද්ධ ඉතිහාසයේ සඳහන් වෙයි

ජීවමාන බුදුරදුන් දුටුවන් දහම් මගට යොමුවීම නිරායාසයෙන් සිදු වුවත් පසු පරම්පරාවන් දහමට යොමු කරද්දී බුදුරජාණන් වහන්සේ පිළිබඳව හඳුන්වා දීම අවශ්‍ය විය. තථාගතයන් වහන්සේ අනුපමේය බැවිනුත්, උන්වහන්සේගේ රූපය පවා විෂයාතික්‍රාන්ත වූ බැවිනුත් මුල් කාලයේදී තථාගතයන් වහන්සේ සංකේතවත් කිරීමට සර්වඥ ධාතූන්, ජය ශ්‍රී මහා බෝධිය, පාරිභෝගික භාණ්ඩ මෙන්ම, ධර්ම චක්‍රය, ශ්‍රී පාද ලාංඡනය, නෙළුම් මල, බෝපත් සටහන් ආදිය භාවිතා කළහ. එහෙත් පසුකාලීනව ප්‍රඥාව හා ශ්‍රද්ධාව අඩු මිනිසුන්ගේ ශ්‍රද්ධාව අවදි කරනු පිණිස තථාගතයන් වහන්සේ ද පුද්ගල ස්වරූපයෙන් දැක්වීමට සිදුවිය. බුද්ධ ප්‍රතිමා නෙලීමට සිදුවූයේ එහෙයිනි.

යමෙක් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කරයිද, එය බොහෝ ජනයාට වැඳුම් පිදුම් කොට කුසල් දහම් වඩන්නන්ටත්, දහමට යොමුවීමටත් උපකාරවේ. දිගු කලක් මුළුල්ලේ දෙව් මිනිසුන්ට යහපත පිණිස හා ශාසනයේ පැවැත්ම පිණිස හේතුවන එම සත් ක්‍රියාව පිණිස හා ශාසනයේ පැවැත්ම පිණිස හේතුවන එම සත් ක්‍රියාව **"මහා කුසලයක්"** ලෙස සැලකෙන්නේ එහෙයිනි. **"බුදු රජානන් වහන්සේ ආමිස පූජාවට වඩා අගය කළේ ප්‍රතිපත්ති පූජාවය"** යි කියමින් මෙබඳු යහපත් දේ පවා හෙලා දකින්නට උත්සාහවත් වන පිරිසක් ද සමාජයේ කවදත් සිටිති. එහෙත් ප්‍රතිපත්තිය වඩන්නටත් ආමිස පූජාවෙන් කෙරෙන මූලික යොමු වීම බොහෝ දෙනාට උපකාර වන බව ඔවුන් වටහාගෙන නැත. ආමිස පූජාවලින් තොරව කෙළින්ම නිවන් මගට යොමුවිය හැකි අය අද කාලේ කලාතුරකින් සිටිය හැකිය. එහෙත් ඔවුන් ද එම හැකියාව වඩවාගෙන ඇත්තේ සසර දිගු කළක් **"ආමිස පූජාවයයි"** කියන මෙම පූර්ව ප්‍රතිපදාව තුළ නිරත වීමෙන් බව අමතක නොකළ යුතුය.

තථාගතයන් වහන්සෙගේ ප්‍රතිමාව, පූජා සත්කාර කිරීමට පමණක් නොව දැක සිත පහදවාගෙන බුදුගුණ ආවර්ජනා කිරීමටද උපකාර වේ. තථාගතයන් වහන්සේගේ ශරීරයේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණත්, නිකෙලෙස් බව හා ගුණ මහත්වයත් නැවත නැවත නුවණින් මෙනෙහි කරන්නහුට එයම බුද්ධානුස්සති භාවනාවක් වේ. එම කුසලචේතනාවෝ ඇතැම් කෙනෙකුට නිවනට මග වශයෙන් සුගතියක උපත ලබා දීමටත්, ඇතැම් කෙනෙකුට එවෙලේම අර්හත්වයට පැමිණීමටත් උපකාර වෙති.

බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු ඥාණයන් පිළිබඳ එක්වරම වටහා ගැනීම දුෂ්කර කෙනෙකුට වුවත් උන්වහන්සේගේ රූපකායේ පෙනෙන බාහිර ලක්ෂණ තුළින් පවා බුද්ධ ගුණ නමැති සාගරයට පිවිසිය හැකිය.



# බුද්ධ රූපය දැක සැගමොක් සුව ලැබුවෝ

## මට්ඨකුණ්ඩලී නම් තරුණයා

බුදුරජාණන් වහන්සේ ජීවමාන කල සැවැත් නුවර මහත් ධන සම්පත් ඇති සිටුවරයෙක් විය. ඔහු කිසිදා කිසිවෙකුට කිසිවක් නොදුන් නිසා **"අදින්න පුබ්බක"** යයි ප්‍රකට විය. ඔහුට එක් පුත්‍රයෙක් සිටියේය. එම පුත්‍රයාට කනේ පළඳින්නට **"කුණ්ඩලාභරණයක්"** සාදවාගෙන එන්න යයි සිටු දේවිය බල කළේය. එය රන්කරුවන් ලවා සාදවන්නට බොහෝ වැටුප් දිය යුතු නිසා, ඒ මුදල වියදම් නොවනු පිණිස රන් කැබැල්ලක් ගෙන තමන් විසින්ම තලා මට්ටම් කොට කනේ පැළඳවීය. මට්ටම් කළ කුණ්ඩලාභරණයක් පැලඳි හෙයින් ඒ දරුවාද මට්ඨකුණ්ඩලී නමින් ප්‍රකට විය.

වයස අවුරුදු දහසයක් පමණ වන විට එම දරුවාට පාණ්ඩු රෝගය වැළඳුණි. දරුවාට බෙහෙත් දෙන්නට වෙදුන් කැඳවාගෙන එන ලෙස දේවිය කියා සිටියත් වෙදුන්ට මුදල් දෙන්නට අකමැති වූ සිටුවරයා වෙදුන් හමුවී මෙබඳු රෝගයකට කිනම් බෙහෙතක් දෙන්නේදැයි විමසීය. වෛද්‍යවරු ඒ ඒ වෙලාවට මොනවා හෝ ඖෂධ කිහිපයක නම් කියති. ඒවා මතක තබාගෙන ඇවිත් දරුවාට එම ඖෂධ වර්ග දුන්නත්, ඒවා රෝගයට නිසි ඖෂධ නොවන හෙයින් රෝගය දිනෙන් දින නරක අතට හැරී දරුවා මරණාසන්න විය. එවිට මොහු බලන්නට එන මහජනයා තමාගේ ධන සම්පත් දකීවි යයි බියපත් වූ සිටුවරයා මරණාසන්න දරුවා එළියේ පිළ මත ගෙනැවිත් තැබීය.

බුදුරජාණන් වහන්සේ එදින උදෑසන මහා කරුණා සමවතින් නැගී සිට ලෝකය බලද්දී මට්ටකුණ්ඩලී දැක ඔහු වෙත වැඩම කළහ. මරණාසන්නව සිටි මට්ඨකුණ්ඩලී තථාගතයන් වහන්සේගේ ඡායා මාත්‍රය දැක චිත්ත ප්‍රසාදය ඇතිකරගෙන අවසන් හුස්ම හෙළූ බැවින් තව්තිසා දෙව්ලොව තිස් යොදුන් උස ස්වර්ණ ප්‍රාසාදයක දෙවඟනන් පිරිවරාගෙන උපත ලැබීය. තමන් කවර කුසලයකින් දෙව්ලොව උපත ලැබුවේදැයි බැලූ මට්ඨකුණ්ඩලී, අවසන් මොහොතේ තථාගතයන් වහන්සේ කෙරෙහි සිත පහදවා ගත් කුසලය දුටුවේය. තමන්ගේ පියා කොහිදයි බලද්දී තම ශරීරය ආදාහනය කරන තැන හඬමින් සිටින බව දැක. එතැනට පැමිණ සංවේගය ඇති කොට බුදුරජාණන් වහන්සේගේ ගුණ ප්‍රකාශ කළේය. එතැනට වැඩමකළ තථාගතයන් වහන්සේ මට්ඨකුණ්ඩලී මුල්කොටගෙන **"මනෝ පුබ්බංගමා"** යන ගාථාව දේශනා කරමින් ධර්ම දේශනා කළහ. එම දේශනාව අවසන මට්ඨකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා සෝවාන් ඵලයට පත්විය.

ගතින් සිතින් දුබලව සිටි මට්ඨකුණ්ඩලී තරුණයාට දෙව්ලොව උපදින්නටත්, සෝවාන් ඵලයට පත්වීමටත් උපකාර වූයේ තථාගතයන් වහන්සේගේ ඡායා මාත්‍රය දැක සිත පහදවා ගැනීමය.

## වුස්සදේව තෙරණුවෝ

පෙර ලංකාද්වීපයෙහි **"කටකන්දරාවාසී වුස්සදේව"** තෙරුණුවෝ යයි ශ්‍රද්ධා සම්පන්න තෙරුන් වහන්සේ නමක් වැඩ සිටියහ. දිනක් උන්වහන්සේ සෑ මළුව අතුගා පිරිසිදු කොට වැලි සකසා, සමව පිහිටි වැලි ඇති මළුව බලමින් බුද්ධාලම්බන ප්‍රීතිය උපදවාගෙන සිටියහ. එකල්හි මාරයා වඳුරු වේසයකින් පැමිණ ගොම විසුරුවා කොළ අතු කඩාදමා මළුව අපවිත්‍ර කොට පළා ගියේය. දෙවන දවසෙහිද තෙරුන් වහන්සේ මළුව ඇමද වැලි සකසා ඒ දෙස බලමින් ප්‍රීතිය උපදවාගෙන සිටියහ. එදින මාරයා මහළු ගොන් වේශයකින් පැමිණ මළුව අපවිත්‍ර කොට පළා ගියේය. තුන්වන දිනයේද තෙරුන් වහන්සේ පෙරසේම මළුව ඇමද ප්‍රීතිය උපදවාගෙන සිටින කල්හි මාරයා කොරෙකුගේ වේශයෙන් පැමිණ පා අද්දමින් ගොස් මළුවේ වැලි විසුරුවා විකෘති කළේය.

එකල්හි තෙරුන් වහන්සේ, මෙබඳු පුරුෂයෙකු යොදුනක් පමණ වූ මේ ගමෙහි දැක නැත. මේ මාරයාවත් දෝයි සිතා **"නුඹ මාරයාදැයි"** ඇසූහ. මාරයා **"එසේයය"** පිළිතුරු දුන්නේය. මාරයා නම් බුදුරදුන්ගේ රූපය මැවිය හැකිය. ඔබ මාරයා නම් බුදුරජාණන් වහන්සේගේ රූපය මවා පෙන්වන්න යයි තෙරුන් වහන්සේ පැවසූහ. බුදුරදුන් වැනි රූපයක් මැවිය නොහැකි වූවත්, තරමක් සමාන රූපයක් මවා පෙන්වන්නෙමියි, මාරයා බුදුරදුන්ගේ රූපය වැනි රුවක් මවාගෙන තෙරුන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියේය. කෙලෙස් සහිතවු මාරයා විසින් මවන ලද බුද්ධ රූප කාය මෙතරම් ශෝභමාන නම් තථාගතයන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂනයෙන් පිරිපුන් ජීවමාන රූපකාය කොතරම් ආශ්චර්යය ඇත්දැයි බුද්ධාලම්බන ප්‍රීතිය උපදවාගත් තෙරුන් වහන්සේ, විදසුන් වඩා පලපුරුදු බැවින් සැනෙකින් අර්හත්වයට පත්වූහ. එය දැනගත් මාරයා, තෙරුන් වහන්සේ විසින් මාව රවටන ලද්දේයයි දොම්නසට පැමිණ අතුරුදහන් විය.

බුද්ධ රූපය මවන ලද්දේ කෙලෙස් සහිත මාරයා විසින් වුවත්, එය සැබෑ රුවක් නොවන බව හොඳින්ම දැන සිටියත්, තෙරුන් වහන්සේට බුද්ධාලම්බන ප්‍රීතිය උපදවා ගැනීමට හා අර්හත් ඵලයට පැමිණීමට එම ඡායා මාත්‍රික රූපය උපකාර විය.

# මෙත් සවිය තවත් සවිමත් වේවා!

මෙත් සවිය යනු නන් ලෙසින් අරුත් ගැන්විය හැකිය. වැඩිමනත්ම සවියක් ලෙස හැඳින්වෙනුයේ කිසියම් ලෙසකින් ජීවිතය පවත්වා ගෙන යනු සඳහා මොනයම් අයුරකින් හෝ ආධාරයක් උපකාරයක් අවශ්‍ය බව පෙනී යන ජන සමූහයක් උදෙසා සිදු කෙරෙන පරිත්‍යාගයන්ය. එම ආධාර උපකාර ලබා දෙනුයේ රජය මගින්, රාජ්‍ය නොවන සංවිධාන මගින්, පුණ්‍යායතන මගින් හෝ පුද්ගලයන් විසින් විය හැකිය. එසේ ලබා දෙන ආධාරය භෞතික වශයෙන්ම ධනය හෝ ශ්‍රමය හෝ ඒ දෙකම මගින් විය හැක. කවුරුන් කුමන අරමුණකින් සිදු කළද එයින් කිසියම් පුද්ගලයෙකුට හෝ පිරිසකට සෙත සැලසේ නම් එය අගය කළ යුතුයි. මන්ද යත් එය මානව වර්ගයාගේ සංවර්ධනය උදෙසා වන බැවිනි.

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය කියා කියන විට දීර්ඝ නාමයකි. එහෙත් එය මෙත්සවිය යන කෙටි යෙදුම විශාල ලෙස අර්ථ ගන්වයි. ආහාර පිණිස, නවාතැන් පිණිස, සුබ විහරණය පිණිස අවශ්‍යතා ඇති කිසියම් ජන කණ්ඩායමකට ආධාර කරනවාට වඩා ඔබ්බට ගිය යමක් එයින් කියන්නට උත්සාහ ගැනේ.

කෑම් බීම්, යාන වාහන, ඇඳුම් පැළඳුම් මේ සියල්ල අවශ්‍යය. එහෙත් ලෝකය සැබෑ අයුරින් දකින්නට නම් ඒවා ලැබීම හෝ ලබාදීම පමණක් ප්‍රමාණවත් නොවේ. හැකි යම්තාක් දුරකට මනසට ආමන්ත්‍රණය කළ යුතුය. මෙත් සවිය සිදු කරන්නේ නැත්නම් සිදු කරන්නට උත්සාහ කරන්නේ ඒ කාර්යයි. මනාව සකස් කළ කෙතක පමණක්ම සරු ලෙස බීජ පැලවේ. අස්වනු සාර්ථක වේ. එලෙස සරු අස්වනු දෙනු පිණිස කෙත සකස් කළ හැක්කේ ඒ පිළිබඳ හොඳ දැනුමක් ඇති විධිමත් වූ වැඩ පිළිවෙලක් ඇති පුද්ගලයෙකුටය. මෙත්සවිය මනස සංවර්ධන වැඩ පිළිවෙලේ නියමුවා ඒ අතින් සියළු සුදුසුකම් සපිරූ අයෙකි. මිනිස් සන්තානයට ආමන්ත්‍රණය කිරීම, නිවැරදි අදහස් ඇතුලත් කිරීම පමණක් නොව, නායකත්වය ලබාදීමද සපුරා කළ හැකි අයෙකු මෙත්සවිය මෙහෙවන දේශය තුළ පමණක් නොව විදේශයටද දැනුම බෙදා දිය හැකි අයෙකු වීම භාග්‍යයකි.

සාමාජික සාමාජිකාවන්ට පමණක් නොව එම පවුල්වල අයටත් අසල්වැසි, දන්නා හඳුනන අයට පමණක් නොව දුර බැහැර පලාත්වල අයටත් වෙනස් අන්දමක අත්දැකීම් ලබා ගන්නට, සාමාන්‍ය අවස්ථා දැක පුරුදු වැඩ සටහන් වලින් බැහැරව, වඩා ගැඹුරට ගිය, එහෙත් සරලව අනුගමනය කළ හැකි වැඩ පිළිවෙලකට මෙත් සවිය මාර්ගයෙන් ඉඩේම අවස්ථාව උදාවී ඇත.


අගනුවර සාමාන්‍ය පන්සලක් මූලස්ථානය කර ගනිමින් මෙත් සවිය ව්‍යාප්ත කර ඇති විවිධ වැඩසටහන් පිළිබඳ ලක්වැසි ජනතාව එතරම් දැනුවත්ද යන්න නම් ප්‍රශ්නයකි. එහෙත් මාධ්‍ය හරහා තම ප්‍රතිරූපය ඔසවා තබන්නට, තමන් බිහි කළ සංවිධානයේ නම යොදා නොගන්නා, කලබලයෙන් තොරව නිවී සැනසිල්ලේ සියලු වැඩ කටයුතු මෙහෙයවන ප්‍රධානියෙකු මෙත් සවිය අලංකාර කළ වටිනා ආභරණයක් බඳුවේ.

මෙත් සවිය මගින් දියත් කර, පවත්වාගෙන යන වැඩ පිළිවෙලේ විශේෂත්වය නම් සියල්ලම දේශපාලනීකරණය වූ සමාජයක එම මඩගොහොරුවට සම්බන්ධ නොවී පාඩුවේ තමන්ගේ සංවිධානයේ වැඩ කටයුතු කරගෙන යන, සමාජයීය වශයෙන් විවිධ මට්ටම් වල පිරිසක් ඒකරාශී වී සිටීමයි. මෙත්සවිය ක්‍රියාත්මක වන්නේ එකම අංශයකින් පමණක් නොවීම වඩා වැදගත්ය. දාන, සීල, භාවනා යන බුද්ධ ධර්මයේ මූලිකාංග තුනම ආවරණය වන පරිදි, විවිධ මාර්ග ඔස්සේ වැඩසටහන් සකස් වීම අගය කළ යුතුය. වැඩසටහන් වලදී එකම සිද්ධස්ථානයක් තෝරාගත් ස්වාමීන් වහන්සේලා කිහිප දෙනෙක් සහභාගී කර නොගන්නා අතර කොළඹ නගරයේ මෙන්ම ඒ ආශ්‍රිත පෙදෙස් වල ද දුරබැහැර පලාත්වලද සිද්ධස්ථාන සහ ස්වාමීන් වහන්සේලාද ඒ ඒ ප්‍රදේශ වල වැසියන්ද සහභාගී කර ගැනීම අගය කළ යුතුය.

මෙහිලා සඳහන් කළ යුතු විශේෂ කරුණ නම් සාමාන්‍යයෙන් ඇස් කණ්නාඩි ලබා දීමේ වැඩ සටහන් වලදී සිදුවන්නේ ආයතනයක් සතුව තිබෙන කණ්නාඩි වලින් කිහිපයක් පළඳවා ආසන්න වශයෙන් ගැලපෙන කණ්නාඩි කුට්ටමක් ලබා දීමයි.

එහෙත් මෙත් සවිය පෙනුමේ යම් යම් දුර්වලතා ඇති අයව කැඳවා, ඇස් පරීක්ෂා කිරීම පිළිබඳ සුදුසුකම් ලත් ආයතනයක මහත්ම මහත්මීන් උපකරණ සමග ගෙන්වා පරීක්ෂණයක් සිදු කරයි. ඉන්පසු එම පරීක්ෂණ ප්‍රතිඵල අනුව කණ්නාඩි විශේෂයෙන්ම එම ආයතනය ලවා සකස් කර ආධාර වශයෙන් විදේශයෙන් පවා ලැබෙන රාමු යොදවා ආවරණයක්ද සහිතව නියම කරගත් දැනුම් දෙන දිනයකදී ලබා දෙනු ලැබේ. පෙනුම මෙන්ම දැනුමද අවශ්‍යවෙ. ජීවිතයේ මහඟු ඵල ලබන්නට ඒ දෙකම එක ලෙස අවශ්‍ය වේ. අප පෙර කළ පිනකින්දෝ පෙනුමද, දැනුමද ලබා දෙන, සැබෑ මඟ පෙන්වන්නකුගේ මූලිකත්වය ඇති. මෙත් සිත් පෙරදැරි මෙත් සවියේ ඇසුර ලබන්නට තරම් වාසනාවන්ත වීමු.

**රංජනී උඩුගොඩ** - සා. අංකය 11-2002



# සීල් පදයක අරුත....



## කාම මිත්‍යාචාර කර්මය සම්පූර්ණ වීම සඳහා පහත අංග හතර සම්පූර්ණ විය යුතුය.

1. සේවනය නොකළ යුතු ස්ත්‍රියක හෝ පුරුෂයකු විම
2. සේවන චිත්තය ඇති වීමය.
3. සේවනයට උත්සාහ කිරීමය.
4. සේවනය ඉවසීම (හෙවත් එහි ආස්වාදය විඳීමය.)

උදාහරණයක් ලෙස ස්ත්‍රීහු ගනිමු. **ඉහත සේවනය නොකළ යුතු ස්ත්‍රීන් ලෙසට පහත ස්ත්‍රීන් දස වර්ගය ඇතුළත් වේ.**


### දස ඉත්ථියෝ (ස්ත්‍රීන් දස වර්ගය)



- මව විසින් රක්නා ලද්දීය,
  **මාතු රක්ඛිතා**
- පියා විසින් රක්නා ලද්දීය,
  **පිතු රක්ඛිතා**
- මව්පියන් විසින් රක්නා ලද්දීය,
  **මාතුපිතු රක්ඛිතා**
- සොහොයුරා විසින් රක්නා ලද්දීය,
  **භාතුං රක්ඛිතා**
- සොහොයුරිය විසින් රක්නා ලද්දීය,
  **භගිනි රක්ඛිතා**
- ඥාතීන් විසින් රක්නා ලද්දීය,
  **ඤාති රක්ඛිතා**
- කුලගෝත්‍රයා විසින් රක්නා ලද්දීය,
  **ගොත්ත රක්ඛිතා**
- ධර්මය මඟින් රක්නා ලද්දීය,
  **ධම්ම රක්ඛිතා**
- ආරක්‍ෂා සහිතව සිටින්නීය (තමා විසින් ම)
  **සාරක්ඛා රක්ඛිතා**
- දණ්ඩාරක්‍ෂකයන් ඇති (තම ආරක්‍ෂාවට දණ්ඩක් තබාගත් ස්ත්‍රිය)
  **සපරිදණ්ඩා රක්ඛිතා**

මෙම ස්ත්‍රීන් දස වර්ගය අනුන් විසින් ආරක්‍ෂා කරන්නියන් ලෙස සැලකෙයි. නිදසුනක් වශයෙන් මව හෝ පියා හෝ විසින් රක්නා ලද්දීය. කිසිදු අනතුරට භාජනය නොවන පරිද්දෙන් සුරක්‍ෂිතව සිටින්නියකි. කාමයෙහි හැසිරීම පිළිබඳ ශික්‍ෂා පදයේ දී මෙම ස්ත්‍රීන් දස දෙනාගෙන් නෙකෙු සමග කාමසේවනයෙහි යෙදීම වරදවා කාමයෙහි හැසිරීමක් ලෙස දැක්වෙයි.

විනය පිඨකය ඇසුරෙනි
සැකසුම :- මහාචාර්ය චන්දන ජයරත්න



ඔරුවක් නැති
හබලක් නැති
සයුරක් ඇති
වෙරළක් නැති
මේ සසර දිහාවේ...
අපි අසරණ වෙලා වගේ
හිතට දැනෙනවා
බුදු හාමුදුරුවනේ

මා කුඩා කල සිට ම මෙම ගීතය අසා ඇත්තෙමි. සැබවින් ම මා සිතුවේ ඔරුවක් ඇතිමුත් හබලක් නැති බවය. වෙරළක් නැතිමුත් සයුරක් ඇති බව ය. නමුදු මෙත් සවිය ගැන දැනගෙන සැබවින්ම සවියක් වූ එයට සම්බන්ධව ගත කළ කෙටි කාලය තුළ දී මා හබල සොයා ගත්තෙමි. ඉතින් මා හබල ප්‍රයෝජනයට ගනිමින් වෙරළට පියමං කරමි. මනුස්ස ආත්මය නම් ඔරුවේ නැගී, උතුම් ධර්ම දේශනාවක් ශ්‍රවණය කොට, තේරුම් ගෙන උතුම් භාවනාවක් නම් වූ හබලෙන් සංසාර සාගරය තරණය කොට ඒ උතුම් නිර්වාණය නමැති වෙරළට පියමං කරමි.

මෙවන් විශාල ගමනක් යන්නට සවිමත් අඩිතාලමක් දැමූ සංසාරයේ තමන් අසරණ යයි දැනෙන නොදැනෙන සියලුදෙනාට සසරින් එතෙර වීමට පාර කියන අපේ ආදරණීය ගුරුතුමාණන්ට මෙම සත්කාරය ඉදිරියටත් කරගෙන යාමට ශක්තිය, ධෛර්යය, වාසනාව, නිදුක් නිරෝගී සුවය ලැබේවායි පතමි.

එමෙන්ම, මෙත් සවියට පාර කියූ සහන් මොරවක සොයුරාණන් ඇතුළු මෙත් සවිය කාර්ය මණ්ඩලයටත් නිදුක් නිරෝගී සුවය පතමි.

තෙරුවන් සරණයි.

සාමාජික අංක - 18-3036

# සත්ත්වයන් උපදිනා ස්ථානයෝ හය හතර දන්නව ද?

## නරකය, ප්‍රේතලෝකය, අසුර ලෝකය හා තිරිසන් අපාය යන සතර අපාය සහ දීව්‍ය ලෝක හය

### නරකය

සඤ්ජීව නරකය, කාල සූත්‍ර නරකය, සංඝාත නරකය, රෞරව නරකය, මහා රෞරව නරකය, තාප නරකය, ප්‍රතාප නරකය,අවිචි මහා නරකය යි මහ නරක අටකි. ඒවා සතරැස්ය. එක් මහ නරකයක එක් පසකින්සතර බැගින් ඔසුපත් නරක නම් වූ කුඩා නගරයෝ ද වෙති. එක් මහා නරකයක් හාත්පස ඇති කුඩා නරක සොළොසකි.

### සඤ්ජීව නරකය

යමපලුන් විසින් එහි උපන් සතත්වයන් ගිනියම් වූ පොළොවෙහි පෙරළා කඩ කඩ කොට කපද්දීත් ඒ සතත්වයන් නැවත නැවත ජීවත් වන බැවින් ඒ නරකය සඤ්ජීව නරකය නම් වේ. අධික ක්‍රෝධයෙන් හා මානයෙන් අනුන් හා කෝලාහල කළෝද, දුබලයන් පෙළූ රජවරු නිලධාරීහුද, දිළින්ඳන් පෙලූ පොහොසතුන් හා මැරයෝද , සතුන් මරන්නෝ ද සඤ්ජීව නරකයේ උපදිති.

### කාලසූත්‍ර නරකය

උපන් සත්වයන් ගිනියම් වූ යපොළොවේ දැලි නූල් ගසා සසින්නා වූ ස්ථානය කාලසූත්‍ර නරකයයි. මාපියන්ට හා මිතුරන්ට ද ගුණවත් මහණ බමුණන්ට ද අපරාධ කළාහු එහි පැසෙති.

### සංඝාත නරකය

මේ නරකයෙහි සත්ත්වයෝ නවයොදුන් ඝන යපොළොවෙහි එරී නිශ්චල ව සිටිති. එහි අහස ගුගුරන්නාක් මෙන් මහ හඬ නංවමින් එරී සිටින නිරිසතුන් අඹරමින් පර්වතයෝ ඔබ මොබ පෙරලෙති. ඒවාට යටවී සතත්වයෝ සුණු විසුණු වෙති. ඇත් අස් ගවාදී සතුන්ටද වද දෙමින් වැඩ ගත්තෝද, සතුන් මැරුවෝද, එහි උපදිති.

### රෞරව නරකය

මෙම නරකයෙහි සත්ත්වයන්ගේ සිරුර තුළට වැද ඇතුළත දවන්නා වු නපුරු දුමක් ඇත්තේය. ඇතුළත පිටත දෙකම දවනු ලැබීමෙන් හඬන නිරි සතුන්ගේ හඬ නිරතුරු ව එහි ඇසෙන බැවින් එයට රෞරව නරකය යැයි කියනු ලැබේ.

### මහා රෞරව නරකය

අතිශයින් රෞද්‍ර වූ ගින්නෙන් හා දුමින් තවනු ලබන සත්ත්වයන්ගේ නිරතුරු පවත්නා මහ හඬ ඇති නිසා ද, සතුන්ගේ ශරීර වලින් ගලන පිරී තිබෙන නිසාද, ඒ නරකයට මහා රෞරව නරකය යැයි කියනු ලැබේ.තුනුරුවන් අයත් වුවද මාපියන් අයත් වුවද වස්තුව පැහැර ගත්තෝ ද විනාශ කළෝ ද එහි උපදිති.

### තාප නරකය

මේ නරකයෙහි යමපලුන් විසින් ලිනිය වූ යපොළොවෙහි ගිනියම වූ යහුල්වල අමුණා තබනු ලැබූ සත්ත්වයෝ ගින්නෙන් දැවෙමින් වෙසෙති. සතුන් පණ පිටින් දවා මැරුවෝද අනුන්ගේ ගෙවල් ගිනි තැබුවෝද එහි උපදිති.

### ප්‍රතාප නරකය

මෙහිදී තාප නරකය නිරිසතුන් පැසෙන අයුරින් දීර්ඝ කාලයක් සත්ත්වයෝ පැසෙති. යනුද මේ නරකයට නමෙකි. මරණින් මතු ඉපදීමක් නැත යැයි මිථ්‍යාදෘෂ්ටියක් ගෙන් පව්කම් කළ අය එහි උපදිති.

### මහ අවීචි නරකය

මේ නරකයෙහි එක් බිත්තියක් නැගෙන ගින්න අනික් බිත්තිය දක්වා ගමන් කරන්නේය. පොළොවෙන් නැගෙන ගිනි ජාලාව උඩ පියන් පත දක්වා නගින්නේය. උඩ පියන් පතින් නික්මෙන ගිනි ජාලාව පොළොව දක්වා බස්නේය. සත්ත්වයෝ නිතරම සදිසාවෙන් එන ඒ ගිනි දැල්වලින් වෙලීදැවෙන්නෝය. අතරක් නැති ව එහි සත්ත්වයෝ ද වෙසෙති. ගිනි දැල්වලින් හා දුක්වලින් ද සත්ත්වයන්ගෙන්ද අතරක් නැති බැවින් ඒ නරකය අවිචි නම් වේ.

පඤ්චානන්තර්ය කර්ම කළෝද බෝසතුන් නැසුවෝද ගුණවතුන් නැසුවෝද චෛත්‍ය බින්ඳෝ ද බොරුක් නැසුවෝ ද රත්නත්‍රයට අයත් වස්තුව පැහැර ගතුවෝද මිත්‍ර ද්‍රෝහීහුද භාර්යාවන්ට අපරාධ කළෝ ද බොරු කීවෝද සුරාපානය කළෝද මිසිදටු ගතුවෝද එහි උපදිති.

### ලෝකාන්තරික නරකය

ලෝකාන්තරික නරකය යනු මහත් වූ ශීත නරකයකි. එය හැම කල්හිම ගනඳුරින් වැසී තිබේ. එහි පත්ලෙහි අතිශයින් ශීතල ජලය ඇත්තේය. නිරිසතුන් වවුලන් සේ පර්වතයට එල්ලී ඔබමොබ යති. ඔවුහු තවත් සත්ත්වයකු දුටු කල්හි ආහාරයක යැයි සිතා අල්ලා ගැනීමට තැත් කරති. එයින් දෙදෙනාම පර්වතයනේ ගිලිහී දියට වැටෙති. එහිදී හුණු තෙල්හි ලූ පිටි බැඳෙන්නාක් මෙන් ඔවුන්ගේ ශරීරයෝ පුපුර පුපුරා ශිතලෙන් බැඳෙති.

### තිරිසන් අපාය

මිනිස් ඇසට නොපෙනෙන තරම් ඉතා කුඩා සත්ත්වයන්ගේ පටන් යොදුන් ගණනක් ඇති සත්ත්වයන් දක්වා සිටින, පා නැත්තා වූද , සිව් පා ඇත්තා වූද, බොහෝ පා ඇත්තා වූද, නොයෙක් සටහන් නොයෙක් ආකාර ඇත්තාවූද, තිරිසන් සමූහය ම තිරිසන් අපායය. නරකය මෙන් ඔවුනොවුන්ට වෙන් වූ තැනක් නැත. ඔවුහු උපනූපන් ඒ ඒ තැන්වලම ඔවුනොවුන් කා ගනිමින් කිසි පිළිසරණක් නැතිව නිරතුරු බියෙන් ත්‍රස්තව ජීවත් වෙති.

### ප්‍රේත අපාය

මිනිසුන්ගේ ප්‍රකෘති ඇසින් නොදැකිය හැකි ධාතු වර්ගයකින් නිර්මිත වූ නොයෙක් ප්‍රමාණ ඇත්තා වූ ද නොයෙක් සටහන් ඇත්තා වූද නොයෙක් ආකාර දුක් ඇත්තා වූද සත්ත්ව කෝටිඨාශයකට ප්‍රේතාපාය යැයි කියනු ලැබේ. ඔවුනට භූමියක් වශයෙන් නියම තැනක් නැත. ප්‍රේතයෝ බොහෝ සෙයින් අතිශයින් කෘශ වූ ඇට නහර මතු වී ඇති බඩේ සම පිට කටුවේ ඇලී ඇත්තවූ දුටුවන් අප්‍රිය වූ ශරීර ඇත්තෝය.

සාගින්න නිවෙන තරමට ආහාරද පිපාසාව සන්සිඳෙන පමණට පැන්ද ඔවුහු නොලබති. එහෙත් අකුශල බලයෙන් ඔවුහු බොහෝ කලක් ජීවත් වෙති. ඔවුන්ගෙන් ඇතැමෙක් කවදාවත් ආහාර පාන නොලබති. ඇතැම්හු මනිසුන්ගේ සෙම් සොටු ආහාර කොට ගනිති. ඇතැම්හු මළකුණු ආහාර කොට ඇත්තෝය. ඇතැම්හු මිනිසුන් ඉවත ලන බත්හුලු ආදිය ආහාර කොට ඇත්තෝය. ඇතැම්හු තමන්ගේ ශරීරයම සුරා කන්නෝය. ඇතැම්හු ඔවුනොවුන්ගේ වන වන පිළිකාවලින් ගලන ලේ සැරව ආහාර වශයෙන් ගන්නෝය.


## අසුරඅපාය

අසුර යන නාමයෙන් දේව ගණයට අයත් කොටසක්ද ඇත්තේය. බෞද්ධ පොත්වල වේපචිත්ති අසුර, පහාරාද අසුර යනාදී නම් වලින් දැක්වෙන්නෝ දේව ගණයට අයත් අසුරයෝය. ඔවුහු දෙවියන් මෙන්ම සැප ඇත්තෝය. අසුර යන නාමය ව්‍යවහාර කරන ප්‍රේතයන් වැනි දුක්ඛිත සත්ත්ව කොට්ඨාශයක්ද ඇත්තේය. අසුරපාය යනු ඒ සත්ත්ව සමූහයමය. ඔවුහුද ප්‍රේතයන් මෙන්ම නොයෙක් ආකාර ශරීර ඇත්තෝය.

## සප්ත කාම වර්ගය

මිනිස් ලොවය, චාතුර් මහා රාජිකය, තාවතිංසය, යාමය, තුසිතය නිර්මාණ රතිය, පරනිර්මිත වසවර්තිය යන මේ ස්ථාන සත දානාදී පින්කම් කළවුන් උපදනා සප්ත කාම ස්වර්ගය. එහි සයක් දිව්‍ය ලෝකයෝය. දිව්‍යලෝක වනාහී මිනිස් ඇසින් දැකිය නොහෙන, මිනිස් කයින් ස්පර්ශ කළ නොහෙන, ධාතු වර්ගයකින් නිර්මිත,ශෝබන විමානයන් හා මරණ බිය පවා අමතක වන තරමේ ප්‍රියංකර භාවයක් ඇති උයන් පොකුණු ආදියෙන් යුක්තවූ පරම රමණීය ස්ථානයෝය. ඒවායින් ප්‍රයෝජන ලැබිය හැක්කේ දෙවියන්ටමය. දිව්‍යලෝක වල උපදින දෙවියෝ වනාහී මිනිසුන් මෙන් කලක් මව්කුසයේ වැස හඬා දුකින් ඉපිද ක්‍රමයෙන් වැඩෙන්නා වූ සත්ත්ව කොටසක් නොව සර්වාංග ප්‍රත්‍යාංගයන්ගෙන් සම්පූර්ණව පහළවීම් වශයෙන් උපදනා සත්ත්ව කොට්ඨාශයකි. ඔවුන්ගේ ජරාවක්ද නැත්තේය. ඔවුන්ගේ ආයුෂද ඉතා දිගය. ඔවුන්ගේ වස්ත්‍රාභරණ පරණ වන්නේද කිලිටි වන්නේ ද නොවේ. ඔවුනට ආහාරපාන සැපයීමට වෙහෙසීමක්ද නැත. දිව්‍ය ස්ත්‍රීහු දරුවන් නොවදති. දරුවන් වැදීමේ, දරුවන් පෝෂණය කිරීමේ කරදරය ඔවුනට නැත. ඔවුහු සෑම කල්හිම නැටුම් ගැයුම් ආදියෙන් සිත් පිනවමින් වෙසෙති. අපාය, අපාය සතරය, මිනිස් ලොවය, දිව්‍ය ලොවය, දිව්‍ය ලෝකය යන මේ එකොළොස් භූමියට කාම භූමිය යැයි කියනු ලැබේ.

- ප්‍රේත වස්තු වර්ණනාවෙනි -



# මාළුවකුගේ අඳෝනාව

පෙර අත්බවයක දී කළ පව් පල දී ලා
මා ඉපදුන සමුදුර තෝරෙක් වී ලා
හැඩි දැඩි මිනිසුන් වටකොට දැල් දා ලා
මා ගොඩ ගත්තා බිලි කොකුවල අමුණා ලා

ජලයේ උන් මෙමට දැන් දිය පොදක් නැත
අව්වේ දැවෙන ගත ගිනියම් වෙලා ඇත
මගෙ ගත තුවාලය මට ඉවසුමක් නැත
මැරී මැරී තුවාලය මට ඉවසුමක් නැත

දානපතියෝ පිරිසක් මා අත ගලා
මිළයට ගත්ත මුවගින් සිනහව පාලා
මහ සඟරුවන වෙත මගේ මස් දන් දීලා
මොක් සැප ලබන බව කියනවා මුමුණා ලා

ඇයි මිනිසුනේ මා මරලා දන් දෙන් නේ
පර පණ නසා කෙලෙසද නිවනට යන් නේ
මගේ මස් බලෙන් අරගෙන ඔබ දන්දෙන් නේ
එය සොරකමක් බව ඇයි ඔබ නොසිතන් නේ

මහ සඟරුවන රස කර මගෙ මස් ගිල ලා
බණ කියනවා දන්නෙද අනුහස් කිය ලා
මළ අයටත් ඉන්න අයටත් පින් දී ලා
මහ සඟරුවන වඩිනව මළකුණු ගිල ලා

මගෙන් සොරගත් මගෙ මස් දන් දෙන් නේ
මගෙ මස් වලින් ඔබේ දිව පින වන් නේ
මේවා ගැන කිසිත් උන් නෑ පව සන් නේ
මගේ මස් කාලාඇයි මට පින් නොම දෙන් නේ

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# ශිෂ්‍යත්ව අයදුම් පත්‍රය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපැල : office@methsaviya.org

01. සිසුවාගේ සම්පූර්ණ නම :......................................................................

......................................................................

ශිෂ්‍යයාගේ උඩුකය පිංතූරය

02. පදිංචි ලිපිනය :......................................................................

:......................................................................

03. උපන් දිනය :..............................................

04. පාසල් යන්නේ නම්, ඉගෙන ගන්නා පාසල :..................................................

..............................................ශ්‍රේණිය..............................

05. මවගේ නම :.............................................. දු:ක: අංකය :..............................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )......... ඇයගේ රැකියාව :..............................................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :......................................................................

06. පියාගේ නම :.............................................. දු:ක: අංකය :..............................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )......... ඇයගේ රැකියාව :..............................................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :......................................................................

07. පවුලේ මාසික ආදායම රුපියල් ......................................................................

08. ඔබ විසින් වෙනත් ශිෂ්‍යත්ව/ ශිෂ්‍යාධාර ලබා ගන්නේ නම් හා / හෝ අතීතයේ ලබා ගත්තේ නම් ඒ පිළිබඳ විස්තර

:......................................................................

:......................................................................

09. සම්පත් බැංකුවේ ගිණුම් අංකය සහ ශාඛාව :

| ගිණුම් හිමියාගේ නම | ගිණුම් අංකය | ශාඛාව |
|---|---|---|
| | | |
| | | |

(ගිණුම් හිමියාගේ බැංකු පොතේ මුල් පිටුවේ ඡායා පිටපතක් අමුණා එවන්න) **වෙනත් බැංකු සඳහා කාර්යයාලයෙන් විමසන්න.**

**මා විසින් ප්‍රකාශ කළ ඉහත සඳහන් සියලු තොරතුරු මා දන්නා පමණින් සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.**

අත්සන :..............................

**(සැලකිය යුතුයි - මෙහි ඇති සියලුම කරුණු සම්පූර්ණයෙන්ම පුරවා එවිය යුතුය. නැතහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)**

ඊළඟ පිටුව →

## විහාරස්ථානාධිපති ස්වාමීන් වහන්සේගේ නිර්දේශය

..............................................................................................................

විහාරස්ථානයේ ඉහත සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අප පන්සලට අයත් සීමාව තුළ ජීවත් වන බවත් / ඉරුදින දහම් පාසලේ ශිෂ්‍යාවක / ශිෂ්‍යයෙකු වන බව / නොවන බවත් හා ශිෂත්වයක් සඳහා සුදුසු බවත් දන්වමි.

විහාරාධිපති නිල මුද්‍රාව :.............................................................. දිනය :..............................

## විදුහල්පතිතුමා / විදුහල්පතිතුමියගේ නිර්දේශය

..............................................................................................................

විද්‍යාලයේ ඉහත නම සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අපගේ පාසලේ .............................. වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර සපයා ඇති තොරතුරු සත්‍ය බව ද දන්වමි. මා දන්නා පමණින් ඇයට / ඔහුට වෙනත් ආධාර මුදලක් නොලැබෙන බවත් ප්‍රකාශ කරමි. ඇය/ ඔහු ශිෂ්‍යත්වයක් සඳහා සුදුසු යැයි නිර්දේශ කරමි.

විදුහල්පති නිල මුද්‍රාව :.............................................. පන්ති භාර ගුරුතුමිය :..............................

## තොරතුරු සත්‍ය බවට මෙත් සවිය සාමාජිකයකු විසින් නිවසට ගොස් පරීක්ෂා කර බලා කරනු බලන නිර්දේශය

මෙත් සවිය සාමාජික අංකය .............................. නම ..............................
වන මා ඉහත සඳහන් දරුවාගේ තොරතුරු සත්‍ය වන බව හා ශිෂ්‍යත්වයක් ලබා දීම සුදුසු / නුසුදුසු යයි නිර්දේශ කරමි.

අත්සන :.............................................. දිනය :..............................

## මෙත් සවිය කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශිෂ්‍යත්වය ප්‍රදානය කරන්නා .............................................................. මයා / මිය.

දු. ක :.............................................. හඳුන්වා දුන් අංකය :..............................

ශිෂ්‍යත්වය ආරම්භ වන දිනය :.............................................. අවසාන වන දිනය :..............................

මාසිකව ප්‍රදානය කිරීමට නිර්දේශිත මුදල රු. :.............................................................. කි.

පරිපාලන නිලධාරි :..............................................

**මෙත් සවිය අසරණ සරණ කමිටු සභාපතිගේ/ මෙත් සවිය ලේකම්ගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**තනතුර** :..............................................

**මෙත් සවිය නිර්මාතෘ හා සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**සභාපති - මහාචාර්ය චන්දන ජයරත්න මහතා :**..............................................

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සගරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරි මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.
මීට අමතරව සම ලේකම් වන චින්තක බණ්ඩාර මහතාගේ පුද්ගලික දුරකතන අංකය (0718 114 477) අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 34 වන භාවනා වැඩසටහන

**34 වන භාවනා වැඩසටහන 2016 ජනවාරි මස 17 ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2015/12/28 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.**

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 30 වන වැඩමුළුව

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 30 වන වැඩමුළුව 2016-03-20 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 30 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2016-02-21 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.**


### දෙමළ භාෂාව

අධ්‍යාපන අමාත්‍යාංශයේ සිටි මෙත්සවිය සාමාජිකාවක් විසින් 6, 7, 8. ශ්‍රේණි සඳහා දෙමළ භාෂාව නිවසට පැමිණ හෝ පංති වශයෙන් උගන්වනු ලැබේ.

කොළඹ/ මහරගම අවට විශේෂයි.

**දුරකථන : 071- 8498324**

### ඇඳුම් මැසීම

සාරි හැට්ට, කාන්තා ඇඳුම් සහ ළමා ඇඳුම් මැසීම භාරගනු ලැබේ.

**සාරි හැට්ට පැය 24 ක් තුල දී මසා දිය හැක.**

විමසීම් : මෙත්සවිය සාමාජික

**දුරකථන : 075 5947947**

### ඇඳුම්

මෙත් සවිය සාමාජිකාවක් විසින් මසා නිම කරන ලද කාන්තා රාත්‍රී ඇඳුම් (නයිටි) ඉතාමත් සාධාරන මිලකට

මෙත්සවිය පොත් අලෙවි සැලෙන් ලබාගත හැක

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්** SIGHT 'N' STYLE OPTOMETRISTS

නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ. (අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758

**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න.)**

## මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ..........

02. ස්ත්‍රී / පුරුෂ භාවය .......... 3. ජාතික හැඳුනුම්පත් අංකය ..........
(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .......... 5. වයස .......... 6. ආගම ..........

07. ස්ථිර ලිපිනය ..........
විද්‍යුත් තැපෑල (e-mail) .......... දු:කඃ නිවස ..........ජංගම ..........

08. දිස්ත්‍රික්කය .......... 9. විවාහක / අවිවාහක බව ..........

10. රැකියා කරන්නේ නම්, ආයතනයේ නම ..........
(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..........

11. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ..........

12. ලිපි එවිය යුතු ලිපිනය ..........

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්
1. ..........
2. ..........

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
1. ..........
2. ..........
3. ..........

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..........

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.
..........

18. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..........
..........

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .......... අයදුම්කරුගේ අත්සන ..........

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..........

.......... ..........
තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ..........

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය සඳුදා, අගහරුවාදා, හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06. දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org / www.methsaviya.lk








තරුණ කමිටුව විසින් ශ්‍රී විජයාරාමයේ ඉදිකළ නව සක්මන් මළුව අභිනවයෙන් විවෘත කළ මොහොත





තරුණ කමිටුව මගින් අසරණ සරණ කටයුතු හා මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා ආධාර එකතු කිරීමට කැට බෙදා දීම






මෙත් සවිය මගින් මහ රෝහලේ හෘදරෝග ඒකකයට අවශ්‍ය උපකරණ පරිත්‍යාග කිරීම - 2015.09.08






මෙත් සවිය මගින් නොමිලයේ පවත්වනු ලැබූ අක්ෂි සායනය සහ ඇස්කන්නාඩි ලබාදීම



# සඳහම් චාරිකාව

## රාජගිරිය කලපළුවාව තපෝවන භාවනා මධ්‍යස්ථානය

දාන - සීල - භාවනා වැඩසටහන සඳහා 2015 දෙසැම්බර් මස 6 වන දින මෙත්සවිය සාමාජික සාමාජිකාවන් සහභාගීවෙමින්...


























[illegible] 2/99, [illegible] - 011 2827044 / 0712 285 680